
* - සහකාර ලේකම් තනතුර දරණ නිලධාරියා ඔහුගේ නිත්‍ය තනතුරට අමතරව ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් තනතුරේ වැඩ බැලීම සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ආවරණ අනුමැතිය ලබා ගැනීමට යටත්ව පත් කර ඇත.

** - නියෝජ්‍ය අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන) ටී.ඩී. බංගමුව මහත්මිය වැවිලි කලාපය සඳහා වූ නව ගම්මාන සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් තනතුරේ ද්විතීයන පදනම මත තාවකාලිකව 2024.12.02 දින සිට 2026.12.01 දින දක්වා වර්ෂ 02ක කාලයක් සඳහා පූර්ණකාලීනව මුදාහැර ඇත.

*** - තාක්ෂණ නිලධාරින් දෙදෙනෙකු (02) කොන්ත්‍රාත් පදනම මත සේවයේ යොදවා ඇත.

1.5 ප්‍රජා යටිතල පහසුකම් අංශයට අයත් අංශ



රූපය 1-5. ප්‍රජා යටිතල පහසුකම් අංශයට අයත් අංශ

1.5.1 පාලන අංශය

- ප්‍රජා යටිතල පහසුකම් අංශයේ පරිපාලන අංශය මගින් එම අංශය යටතේ පවත්නා සියලුම ආයතනයන්හි මනා සම්බන්ධීකරණයක් පවත්වාගෙන යාම සඳහා ක්‍රියා කිරීම.
- මානව සම්පත් නිසි ලෙස කළමනාකරණය කරමින් අනුමත සේවක සංඛ්‍යාව තුළ සියලුම අංශයන්හි රාජකාරී වගකීම් සැළකිල්ලට ගෙන කාර්ය මණ්ඩලය බෙදාහැරීම.
- මෙම අංශය යටතේ පවත්නා සෞම්‍යාමූර්ති තොණ්ඩමාන් අනුස්මරණ පදනම සහ ඒ යටතේ පවත්නා ආයතන සඳහා කාලයක සිට ගැටලුවක්ව පැවති ස්ථීර කාර්ය මණ්ඩලය නොමැති වීමේ ගැටලුව කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙතින් විධිමත් පරිදි අනුමත කර ගැනීමෙන් අනතුරුව ඒ සඳහා බඳවා ගැනීම් පටිපාටි අනුමත කර ගැනීමට කටයුතු කර ඇත.
- නිලධාරින්ගෙන් සඵලදායි සහ කාර්යක්ෂම සේවයක් ලබා ගැනීම සඳහා සියලු නිලධාරින්ගේ දැනුම. ආකල්ප, කුසලතා වර්ධනය සහ නිලධාරීන් අභිප්‍රේරණය කිරීම සඳහා හඳුනාගත් විද්වතුන් මගින් විද්වත් හමුව නමින් දේශන මාලාවක් පැවැත්වීම.
- මෙම අංශය විවිධ විෂය නාමයන් යටතේ පැවති බැවින් විවිධ අමාත්‍යාංශයන්හි නමින් පැවති වාහන 40 ක් ලියාපදිංචි බලපත්‍ර, 2024 වර්ෂයේදී එවකට පැවති ජල සම්පාදන සහ වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් නමින් පවරා ගැනීමට කටයුතු කරනු ලැබීය.

1.5.2 සංවර්ධන අංශය

- වැවිලි අංශයේ ජනතාවගේ සුභ සාධනය, ඔවුන්ගේ වාසස්ථාන, ජීවන තත්ත්වය හා සමාජ ආර්ථික පහසුකම් වැඩි කිරීම උදෙසා ප්‍රජා යටිතල පහසුකම් අංශය යටතේ පවතින ආයතන, දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, හා පළාත් පාලන ආයතන ඔස්සේ මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කරවීම.
- මෙම ව්‍යාපෘති සම්බන්ධීකරණය පිළිබඳ සියළු වගකීම් දරමින් රජයේ ඒකාබද්ධ අරමුදලින් හා ඉන්දියානු රජයේ සහය යටතේ ලබා දෙන අරමුදල්ද යොදවමින් ප්‍රජා යටිතල පහසුකම් අංශයේ අරමුණු හා ඉලක්ක කරා මෙහෙයවීමේ කාර්යභාරය සංවර්ධන අංශය මගින් සිදු කරනු ලබයි.

පහත සඳහන් ක්‍රියාකාරකම් ඇතුළුව, ඉහත කර්තව්‍යයන් නිසිලෙස ක්‍රියාත්මක කිරීම සඳහා ඉංජිනේරු අංශය මෙන්ම සැළසුම් අංශයද සංවර්ධන අංශයට සහය දක්වනු ලබයි.

යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.

- පේලි නිවාසයන්හි අබලන් වූ වහලයන් නැවත සෙවිලි කිරීම.
- සෞඛ්‍යාරක්ෂිත පානීය ජල සැපයුම් ක්‍රම ඇති කිරීම සහ වැඩිදියුණු කිරීම.
- සනීපාරක්ෂාව වැඩිදියුණු කිරීමේ ව්‍යපෘති.

වතු නිවාස වැඩසටහන යටතේ පහත ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.

- නව ජීවන නිවාස වැඩසටහන යටතේ නිවාස ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
- ඉන්දියානු රජයේ ආධාර යටතේ ඉදිකරනු ලබන නිවාස වැඩසටහන සමායෝජනය සහ අධීක්ෂණය කිරීම.
- නව ජීවන නිවාස වැඩසටහන සහ ඉන්දියානු රජයේ ආධාර යටතේ ඉදිකරනු ලබන නිවාස වැඩසටහන යටතේ ඉදිකරනු ලබන නිවාස සඳහා ජලය, මාර්ග සහ විදුලි සැපයුම් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
- නව ජීවන නිවාස වැඩසටහන් වලට අදාළ ණය වාරික අයකර ගැනීම.
- තොණ්ඩමාන් අනුස්මරණ පදනම යටතේ ඇති, හැටන් හි පිහිටි තොණ්ඩමාන් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය, රම්බොඩ පිහිටි තොණ්ඩමාන් සංස්කෘතික මධ්‍යස්ථානය, නෝර්වුඩ් හි පිහිටි තොණ්ඩමාන් ක්‍රීඩා සංකීර්ණය සහ ප්‍රජා ශක්ති (E–kios) සංවර්ධන මධ්‍යස්ථාන යනාදියෙහි සමස්ථ අධීක්ෂණය.
- විදේශ ආධාර යටතේ හැටන් හි පිහිටි තොණ්ඩමාන් වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන වැඩිදියුණු කිරීම.
- සංවර්ධන ව්‍යාපෘති අනුමත කිරීම, නියාමනය කිරීම හා ප්‍රගතිය අනුව ගෙවීම නිර්දේශ කිරීම.
- ඉදිකිරීම් හා වෙනත් සංවර්ධන ව්‍යාපෘති වලට අදාළ ප්‍රගති වාර්තා හා ප්‍රසම්පාදන වාර්තා ඉදිරිපත් කිරීම.

1.5.3 සැළසුම් අංශය

- වැවිලි ප්‍රජාවගේ උන්නතිය සඳහා වූ ප්‍රතිපත්ති හා වැඩසටහන් හඳුනාගැනීම හා ප්‍රජා යටිතල පහසුකම් අංශයේ ක්‍රියාකාරී සැළැස්ම සැකසීම.
- සංවර්ධන වැඩසටහන් සඳහා අවශ්‍ය ප්‍රතිපාදන මහාභාණ්ඩාගාරයෙන් වෙන් කරවා ගැනීම.
- සංවර්ධන ප්‍රතිපත්ති සැකසීමේදී සහාය ලබාදීම හා ප්‍රජා යටිතල පහසුකම් අංශයේ වාර්ෂික ක්‍රියාකාරී සැළැස්ම සැකසීම.
- ප්‍රගති වාර්තා පිළියෙළ කිරීම හා සංවර්ධන වැඩසටහන් සඳහා ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම.
- ප්‍රජා යටිතල පහසුකම් අංශයේ සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කිරීමට අදාළ ප්‍රාග්ධන ඇස්තමේන්තු සැකසීම.

- නව සංවර්ධන ව්‍යාපෘති හඳුනාගැනීම හා ව්‍යාපෘති යෝජනා සැකසීම.
- ස්ථාන පරීක්ෂාව, අධීක්ෂණය සහ ක්ෂේත්‍ර චාරිකා පැවැත්වීම.
- යෝජිත ව්‍යාපෘති ගෙන්වා ගැනීම, ඒ අතුරින් සුදුසු ව්‍යාපෘති හඳුනා ගැනීම, ශක්‍යතා ඇගයීම, ව්‍යාපෘති මෙහෙයවීම හා ඇගයීම, ක්ෂේත්‍ර නිරීක්ෂණ, ප්‍රගති සමාලෝචනය, මූල්‍ය ප්‍රගතිය හා භෞතික ප්‍රගතිය ඇතුලත් ප්‍රගතිය වාර්තා සැකසීම හා අදාළ ආයතන වෙත යොමු කිරීම .
- ග්‍රාමීය ප්‍රදේශවල ජීවනෝපාය සහ මූලික පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා විශේෂ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, අදාළ ආයතන සම්බන්ධීකරණය හා පහසුකම් සැළසීම.
- වතු ප්‍රජාවගේ මූලික අවශ්‍යතා පිළිබඳ තොරතුරු යාවත්කාලීන කොට පවත්වා ගෙන යාම.
- වැවිලි ප්‍රජා සන්නිවේදන පහසුකම් සළසන නිලධාරීන් හා ප්‍රජා ශක්ති නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය සඳහා පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.
- ප්‍රජා යටිතල පහසුකම් අංශයේ වාර්ෂික කාර්යසාධන වාර්තා සකස් කොට පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.
- ප්‍රජා යටිතල පහසුකම් අංශයේ සංවර්ධන වැඩසටහන් සඳහා අමාත්‍ය මණ්ඩල සංදේශ සැකසීම.
- වාර්ෂික සංවර්ධන සැළැස්ම සකස්කිරීම.
- තිරසාර සංවර්ධන ඉලක්ක පදනම් කරගත් වැඩසටහන් හා ව්‍යාපෘති සම්බන්ධීකරණය කිරීම.
- ජාතික මට්ටමේ සංවර්ධන වැඩසටහන් සඳහා වතු නිවාස අංශය වෙනුවෙන් නියෝජනය කිරීම.

1.5.4 ගිණුම් අංශය

- ප්‍රජා යටිතල පහසුකම් අංශය හා ඒ යටතේ ඇති ආයතන සඳහා අවශ්‍ය භාණ්ඩ හා සේවා ප්‍රසම්පාදන ක්‍රියාවලිය මගින් ලබාදීම, වැටුප් හා දීමනා ගෙවීම, සංවර්ධන ක්‍රියාවලියන්ට අදාළ ගෙවීම් කිරීම, නඩත්තු කටයුතු ආදී රාජ්‍ය අරමුදල් මගින් සිදු කරන ගෙවීම් සම්බන්ධ සියළු කටයුතුවල වගකීම ගිණුම් අංශය මගින් දරනු ලබයි.
- ප්‍රජා යටිතල පහසුකම් අංශයේ විෂය පථයට අයත් අංශ හා ආයතනවල මූල්‍ය කළමනාකරණය.
- ප්‍රසම්පාදන සැළැස්ම සකස් කිරීම හා කළමනාකරණය.
- වත්කම් කළමනාකරණය.
- මූල්‍ය කළමනාකරණය සඳහා නව තාක්ෂණික ක්‍රම භාවිතා කිරීම.
- මූල්‍ය කළමනාකරණය හා සම්බන්ධ පුහුණු හා සංවර්ධන කටයුතු
- විගණනයට අදාළ කටයුතු සම්බන්ධීකරණය කිරීම

1.5.5 අභ්‍යන්තර විගණන අංශය

- ප්‍රජා යටිතල පහසුකම් අංශයේ මූල්‍ය කටයුතු පිළිබඳව පවත්නා අභ්‍යන්තර පාලන ක්‍රමය පිළිබඳව ඇගයීම් සිදු කරමින් අඩුපාඩු වැලැක්වීම සහ අනාවරණය කර ගැනීම සඳහා භාවිතා කරනු ලබන අභ්‍යන්තර පරීක්ෂාවන්හි විධිමත් බව හා ප්‍රමාණවත් බව පිළිබඳව අබණ්ඩ ඇගයීමකට ලක් කිරීම.
- වාර්ෂික ප්‍රතිපාදන මත ඉටු කරනු ලබන සංවර්ධන ව්‍යාපෘති සහ යෝජනාක්‍රම ක්‍රියාත්මක කිරීම පිළිබඳව ප්‍රගතිය නිශ්චය කිරීමට සහායවීමත්, ප්‍රගති සමාලෝචන රැස්වීම් වලදී අදාළ කරුණු අනාවරණය කිරීමත්, වාර්ෂික විගණන සැලැස්ම සකස් කිරීමත්, විගණන විමසුම් මඟින් පෙන්වා දුන් කරුණු නිවැරදි කර ගැනීමත්, විගණන කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීම සම්බන්ධීකරණය කිරීම.
- ප්‍රජා යටිතල පහසුකම් අංශයේ අභ්‍යන්තර පාලන පද්ධති ඇගයීම් කිරීම හා ප්‍රජා යටිතල පහසුකම් අංශය මගින් ක්‍රියාත්මක සංවර්ධන ව්‍යාපෘති මෙන්ම ප්‍රජා යටිතල පහසුකම් අංශයේ අනෙකුත් ක්‍රියාකාරකම් පිළිබඳ විගණන නිරීක්ෂණ මහාභාණ්ඩාගාරය වෙත වාර්තා කිරීමත් අභ්‍යන්තර විගණන අංශය විසින් මූලික වශයෙන් ඉටු කරනු ලබයි.

- විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 3ක් 2024.03.26, 2024.07.03 සහ 2024.10.11 යන දිනයන්හි පවත්වා ඇත.
- අභ්‍යන්තර විගණන අංශය විසින් සිදු කරන ලද අභ්‍යන්තර විගණන විමසුම් සංඛ්‍යාව 15ක් වන අතර විශේෂ විමර්ශන කටයුතු සංඛ්‍යාව 4කි.

1.5.7 ඉංජිනේරු අංශය

- Architectural හා Design Drawings සඳහා අනුමැතිය ලබා දීම.
- පිරිවිතරයන් හා ඇස්තමේන්තු වලට නිර්දේශ ඉදිරිපත් කිරීම.
- විවිධ අරමුදල් ප්‍රභවයන් හරහා ක්‍රියාත්මක වන සංවර්ධන ව්‍යාපෘති අධීක්ෂණය කිරීම හා උපදේශන සේවාවන් සැපයීම.
- ව්‍යාපෘති අධීක්ෂණය කිරීම.
- තාක්ෂණික ඇගයීම් කමිටු හා තාක්ෂණික විගණනයන් වලට සහභාගී වීම.
- ඉදි කිරීම් ව්‍යාපෘති වලට නව ක්‍රමවේදයන් හඳුන්වාදීම.
- ස්ථාන පරීක්ෂාව, අධීක්ෂණය සහ ක්ෂේත්‍ර චාරිකා පැවැත්වීම.
- විදේශ ආධාර යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘතීන් අධීක්ෂණය කිරීම හා ඇස්තමේන්තු සැකසීම.

1.6 ප්‍රජා යටිතල පහසුකම් අංශය යටතේ සෞම්‍යාමූර්ති තොණ්ඩමාන් අනුස්මරණ පදනම

සියලු ප්‍රජාව අතර සාමය, හොඳ හිත, අවබෝධය සහ සහයෝගීතාවය ප්‍රවර්ධනය කිරීම, ජාතීන් අතර එකමුතුකම සහ සමාජ සංකලනය ප්‍රවර්ධනය කිරීම හා ධෛර්යමත් කිරීම, ආගමික, අධ්‍යාපනික, වෘත්තීමය, සමාජයීය, දේශපාලන, ආර්ථික, සෞන්දර්යාත්මක හා භෞතික සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම හා අවබෝධය නංවාලීම ආදී කරුණු තුළින් යහපත් ජන සමාජයක් බිහිකිරීම උදෙසා ‘‘සෞම්‍යාමූර්ති තොණ්ඩමාන් අනුස්මරණ පදනම’’ 2005 අංක 19 දරණ පාර්ලිමේන්තු පනත මගින් 2005වර්ෂයේදී ස්ථාපිත කරන ලදී.

1.හැටන්හි පිහිටි තොණ්ඩමාන් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය (TVTC)
2.රම්බොඩ පිහිටි තොණ්ඩමාන් සංස්කෘතික මධ්‍යස්ථානය (TCC)
3.නෝර්වුඩ්හි පිහිටි තොණ්ඩමාන් ක්‍රීඩා සංකීර්ණය (TSC)
4. ප්‍රජාශක්ති සංවර්ධන මධ්‍යස්ථාන- 44

සෞම්‍යාමූර්ති තොණ්ඩමාන් අනුස්මරණ පදනමෙහි සංවර්ධන වැඩසටහන් සඳහා 2024 වර්ෂයේ රු.මිලියන 26.76 ක ප්‍රතිපාදන ප්‍රමාණයක් වෙන් කර ඇත. 2024.12.21 දිනට මෙහි වියදම රු. මිලියන 19.01කි.

1.6.1.1හැටන්හි පිහිටි තොණ්ඩමාන් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය

TVTC ආයතනයට වසරකට සිසුන් 400 ක් පුහුණු කිරීමේ හැකියාව ඇත. වර්තමානයේ, වසරක් සහ මාස හයක කාලයක් සහිත පාඨමාලා පවත්වනු ලැබේ. සිසුන් ඇතුළත් කර ගැනීමේ ක්‍රියාවලීන් පවත්වන ලද අතර, විවිධ වර්ගයේ පාඨමාලා සඳහා පුහුණු සිසුන් 248 ක් පමණ ලියාපදිංචි කරන ලදී. 2023 දී මාස හයක (කණ්ඩායම් 2) සහ වසර 1 ක පාඨමාලා සඳහා සිසුන් 283 දෙනෙකු පුහුණුව සඳහා සහභාගී විය. (YTD) - වසර දක්වා සිසුන් 206 දෙනෙකු TVTC හි අධ්‍යාපනය ලබති.

1.6.1.2 රම්බොඩ පිහිටි තොණ්ඩමාන් සංස්කෘතික මධ්‍යස්ථානය

ඉන්දියානු සම්භවයක් ඇති වතුකරයේ සහ ප්‍රජාවේ සංස්කෘතික අනන්‍යතාවය ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම සඳහා තොණ්ඩමන් සංස්කෘතික මධ්‍යස්ථානය සහ සෞන්දර්ය විද්‍යාලය රම්බොඩ හි පිහිටුවන ලදී. නර්තන හා සංගීත පන්ති අර්ධකාලීන (අවිධිමත්) පාඨමාලා ලෙස පැවැත්විය යුතු නමුත් පූර්ණ කාලීනව නොවේ.

නර්තන, සංගීතය, කලාව, වීණා, වයලීනය, මිරුතංගම්, හාර්මෝනියම් සහ අනෙකුත් විධිමත්, අවිධිමත් පාඨමාලා ඇතුළු TCC හි ක්‍රියාකාරකම් කිහිපයකට පුද්ගලයින් 251 දෙනෙකු (2014-2021) සහභාගී වූහ.

2021 දී, වසංගතය අතරතුර COVID-19 රෝගීන් සඳහා TCC අතරමැදි සත්කාර මධ්‍යස්ථානයක් (ICC) බවට පරිවර්තනය කරන ලදී. වසංගතයෙන් පසු, 2023 දී ICC වසා දමන ලද නමුත් සංස්කෘතික මධ්‍යස්ථානය තවමත් දේශන කටයුතු නැවත ආරම්භ කර නොමැත. දැනට එය ශාලා වෙන්කරවා ගැනීම් සහ කුඩා වගා කටයුතු සඳහා පමණක් භාවිතා වේ. 2025 ක්‍රියාකාරී සැලැස්මේ කොටසක් ලෙස සෞන්දර්ය විද්‍යාල කටයුතු නැවත ආරම්භ කිරීම සඳහා STMF සමඟ කටයුතු කිරීමට මෙන්ම TCC තුළ IOT කෞතුකාගාරයක් පිහිටුවීමට සැලසුම් තිබේ.

1.6.1.3 නෝර්වුඩ්හි පිහිටි තොණ්ඩමාන් ක්‍රීඩා සංකීර්ණය

තොණ්ඩමාන් ක්‍රීඩා සංකීර්ණය, විශේෂයෙන් සේවා නොලැබූ සහ අඩු පහසුකම් සහිත ග්‍රාමීය ප්‍රජාවගේ භෞතික සංවර්ධනය සඳහා ස්ථාපිත කරන ලදී. පාපන්දු, වොලිබෝල්, ක්‍රිකට්, නෙට්බෝල් සහ අනෙකුත් ක්‍රීඩා ක්‍රියාකාරකම් ඇතුළු ක්‍රියාකාරකම් කිහිපයකට පුද්ගලයින් 942 (2023) ක් සහභාගී වූහ.2024 වර්ෂය දක්වා නෝර්වුඩ් ක්‍රීඩා සමාජයේ ක්‍රියාකාරකම් කිහිපයකට පුද්ගලයින් 746 ක් සහභාගී වූහ.

1.6.1.4 ප්‍රජාශක්ති සංවර්ධන ව්‍යාපෘතිය

2006 සිට නුවරඑළිය, බදුල්ල, කෑගල්ල, මහනුවර, රත්නපුර, මාතලේ, කළුතර, ගාල්ල, මාතර සහ මොනරාගල දිස්ත්‍රික්කවල වතු ප්‍රදේශ ආවරණය වන පරිදි ප්‍රජාශක්ති මධ්‍යස්ථාන 44ක් හරහා ප්‍රජාශක්ති සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක වේ.

2024 ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාලය තුළ ප්‍රජාශක්ති මධ්‍යස්ථාන විසින් සමහර උත්සව පවත්වන ලද අතර සහභාගී වූවන් 47,590 දෙනෙකු එම ක්‍රියාකාරකම් වලින් ප්‍රතිලාභ ලබා ගන්නා ලදී. එම ප්‍රධාන ක්‍රියාකාරකම් ලෙස ඇඳුම් මැසීම, වෛද්‍ය සහ සෞඛ්‍ය වැඩසටහන් සහ අනෙකුත් සමාජ වැඩිදියුණු කිරීමේ ක්‍රියාකාරකම් හැඳින්විය හැක.

වගුව 1-6. ප්‍රජාශක්ති සංවර්ධන ව්‍යාපෘතිය හරහා සිදුකළ වැඩසටහන් (2024. 12.31 දිනට)

#	වැඩසටහනේ නම	වැඩසටහන් සංඛ්‍යාව	ප්‍රතිලාභීන් ගණන
1	සිසු සිසුවියන්ගේ පැමිණීම (පරිගණක සහ පාසල් පදනම් කරගත්)	මධ්‍යස්ථාන 44	15,699
2	ශිෂ්‍ය පැමිණීම	මධ්‍යස්ථාන 44	471
3	කාය වර්ධන ක්‍රියාකාරකම් (Gym Youth Activities	මධ්‍යස්ථාන 44	457
4	රෙදි මැසීම	මධ්‍යස්ථාන 44	405
5	අධ්‍යාපනය	75	3,804
6	සංක්‍රමණය	19	2,891
7	කාන්තාවන් සහ ගැහැණු ළමුන්	69	2,449
8	සෞඛ්‍යය හා ආරක්ෂාව	79	7,155
9	මධ්‍යසාර සහ මත්ද්‍රව්‍ය නිවාරණය	57	5,987
10	ස්ත්‍රී පුරුෂ සමානත්වය	38	3,813
11	පරිසරය ආරක්ෂා කිරීම	28	1,108
12	පෝෂණය සහ ආහාර සුරක්ෂිතතාව	42	1,472
13	තරුණ සේවානියුක්ති වැඩසටහන	8	315
14	සමාජ හා ප්‍රජා මූලික වැඩසටහන් දැනුවත් කිරීම, ජංගම සේවා, තරුණ වැඩසටහන, රැස්වීම	19	931
15	සැමරීම්	21	633
	සමස්ථ ප්‍රතිලාභීන් සංඛ්‍යාව		**47,590**

1.6.2 වැවිලි මානව සංවර්ධන භාරය

වැවිලි අංශයේ වෙසෙන ජනතාවගේ ජීවනෝපාය මාර්ග වැඩි දියුණු කිරීම උදෙසා, 1992 සැප්තැම්බර් මස 18 වන දින 1982 අංක 17 දරණ සමාගම් පනත යටතේ, ලියාපදිංචි සමාගමක් වශයෙන් ''වතු නිවාස හා සමාජ සංවර්ධන භාරය'' පිහිටුවන ලදී.1992 දී රජය විසින් ගනු ලැබූ ප්‍රතිපත්තියකට අනුව JEDB (ජනතා වතු සංවර්ධන මණ්ඩලය), Elkaduwa සහ SLSPC (ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව) යටතේ ඇති වැවිලි සමාගම්, ප්‍රාදේශීය වැවිලි සමාගම් 23ක් යටතේ ඔවුන්ගේ කළමනාකාරීත්වය පැවරීම හරහා පෞද්ගලීකරණය කරන ලදී. පෞද්ගලීකරණයෙන් පසු කෙටි කාලයක් තුළ JEDB සහ SLSPC ආයතන, වැවිලි ප්‍රජාවේ සෞඛ්‍ය, සමාජ සුභසාධන සහ ජීවනෝපාය කටයුතු වැඩිදියුණු කිරීම සඳහා PHSWT (වතු නිවාස හා සමාජ සංවර්ධන අරමුදල) ලෙස ඒකාබද්ධ කරන ලදී. 2002 ඔක්තෝබර් 25 වන දින මෙම සංවිධානය වැවිලි මානව සංවර්ධන භාරය (PHDT) ලෙස ප්‍රතිනාමගත කරන ලද අතර මෙම භාරය 2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ නැවත ලියාපදිංචි කර ඇත. වතු ප්‍රජාවගේ යහපත උදෙසා පිහිටුවා ඇති මෙම ආයතනය, යටිතල පහසුකම් හා සමාජ සංවර්ධන වැඩසටහන් රැසක් මෙහෙයවීමෙහිලා රජයේ අදාල අමාත්‍යාංශ, ව්‍යවස්ථිය සමිති, ප්‍රාදේශීය වැවිලි සමාගම්, ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන හා වෙනත් දේශීය රාජ්‍ය නොවන සංවිධාන සහ රාජ්‍ය හා පුද්ගලික ආයතන සමග සහයෝගයෙන් කටයුතු කරයි.

PHDTහි කාර්යයන් සිදු කරනු ලබනුයේ අතිගරු ජනාධිපතිතුමා විසින් පත් කරනු ලබන සභාපතිවරයෙකුගෙන් සමන්විත අධ්‍යක්ෂ මණ්ඩලයක් හරහාය. ඊට මහා භාණ්ඩාගාරයේ හා ප්‍රාදේශීය වැවිලි සමාගම්වල මෙන්ම ව්‍යවස්ථිය සමිතිවල නියෝජිතයින්ද ඇතුළත් වේ. මෙහි ප්‍රධාන කාර්යාලය බත්තරමුල්ලේ පිහිටා ඇති අතර ප්‍රාදේශීය කාර්යාලයන් ගාල්ල, රත්නපුර, බදුල්ල, කෑගල්ල, මහනුවර, හැටන් හා නුවරඑළිය පිහිටි ප්‍රාදේශීය කාර්යාලයන් 7ක් හරහා බලගැන්වෙන අතර ප්‍රාදේශිකයන්හි කටයුතු ප්‍රාදේශීය අධ්‍යක්ෂවරයෙකුගෙන් හා තාක්ෂණික, සෞඛ්‍ය, මූල්‍ය හා පරිපාලන කාර්යය මණ්ඩලයක් හරහා ක්‍රියාත්මක වේ.

ප්‍රජා යටිතල පහසුකම් අංශයේ ප්‍රතිපාදන හරහා වැවිලි මානව සංවර්ධන භාරය විසින් සිදුකරනු ලබන සංවර්ධන කටයුතු වල ප්‍රගතිය

වතු නිවාස හා යටිතල පහසුකම් සංවර්ධනය

වතුකරයේ ප්‍රජාවගේ ජීවන තත්ත්වය නංවාලීම සඳහා 2024 වර්ෂයේදී නිවාස ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රතිපාදන වශයෙන් රු. මිලියන 500ක් වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය වෙත වෙන් කරන ලදී. ඒ අනුව ක්‍රියාත්මක කරන ලද නිවාස ව්‍යාපෘතීන්හි ප්‍රගතිය පහත පරිදි වේ.

වගුව 1-7. 2024.12.31 දිනට නව නිවාස ව්‍යාපෘතීන්හි භෞතික ප්‍රගතිය

ප්‍රදේශිකය/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය	2017 අනුමත වූ	2018 අනුමත වූ	2020 අනුමත වූ	2021 අනුමත වූ
ගාල්ල	-	-	-	-
රත්නපුර	-	-	-	-
බදුල්ල	-	-	-	-
කෑගල්ල	-	-	-	15
මහනුවර	18	15	-	17
හැටන්	31	58	35	60
නුවර එළිය	98	-	-	30
කළුතර	-	-	-	-
එකතුව	147	73	35	122

ඒ අනුව 2017, 2018, 2020 සහ 2021 අනුමත වූ 2024 වර්ෂයේ ඉදිකිරීම් අවසන් කළ නිවාස ව්‍යාපෘති 377 ක් වන අතර මෙම නිවාස ව්‍යාපෘති ඉදිකිරීමට අමතරව, වැවිලි මානව සංවර්ධන භාරය විසින් මෙම නිවාස සඳහා අත්‍යවශ්‍ය යටිතල පහසුකම් සැපයීමද සිදුකරනු ලබයි. ඒ අනුව 2024 වර්ෂයේ විදුළි ව්‍යාපෘති 3ක් හා ජල ව්‍යාපෘතියක් සම්පූර්ණ කර ඇත. මීට අමතරව, 2023 හි ඉදිකිරීම් අවසන් කළ නිවාස සඳහාද 2024 යටිතල පහසුකම් සංවර්ධන කටයුතු සිදුකරන ලදී. මේ යටතේ ජල ව්‍යාපෘති 09ක් හා විදුළි ව්‍යාපෘති 1ක් සම්පූර්ණ කර ඇත.

1.6.3 වැවිලි කලාපය සඳහා වූ නව ගම්මාන සංවර්ධන අධිකාරිය

වැවිලි ප්‍රජාවගේ උන්නතිය සඳහා ක්‍රියාත්මක වන සංවර්ධන කටයුතු කඩිනමින් ඉටු කිරීමේ අරමුණින් අමාත්‍යාංශයට අනුබද්ධිතව රාජ්‍ය ආයතනයක් පවත්වාගැනීමේ අවශ්‍යතාවය මත 2018.06.25 වන දින, "වැවිලි කලාපය සඳහා වූ නව ගම්මාන සංවර්ධන අධිකාරිය" පිහිටුවීමට ක්‍රියාකළ අතර ඊට අදාල 2018 අංක 32 දරණ පනත, පාර්ලිමේන්තුව මගින් සම්මත කරන ලදුව එහි මෙහෙයුම් කටයුතු 2019 වර්ෂයේ පෙබරවාරි 7 වැනි දින සිට ආරම්භ කරන ලදී.අධිකාරියේ කළමණාකාරීත්වය 13 දෙනෙකුගෙන් සැදුම්ලත් කළමණාකරණ මණ්ඩලයකින් සමන්විත වන අතර ගරු අමාත්‍යතුමා විසින් මෙහි සභාපතිතුමන්ව පත් කරනු ලැබේ. එසේම "අධ්‍යක්ෂ ජනරාල්" අධිකාරියේ ප්‍රධාන විධායක නිලධාරියා වේ. කාර්යය මණ්ඩලය සඳහා කාණ්ඩ 14ක් යටතේ තනතුරු 28කි.

වැවිලි කලාපය සඳහා වූ නව ගම්මාන සංවර්ධන අධිකාරිය හරහා සිදු කරන ලද කාර්යභාරයන්හි භෞතික ප්‍රගතිය පහත පරිදි ඉදිරිපත් කල හැක.

වගුව 1-8. 2024.12.31 දිනට ආයතනයේ සංවර්ධන වැඩසටහන්වල භෞතික ප්‍රගතිය

අනු අංකය	ව්‍යාපෘතිය/ වැඩසටහන	අරමුණ / උපායමාර්ග	වෙන් කල මුදල රු. මිලියන	සත්‍ය වියදම රු. මිලියන	භෞතික ප්‍රගතිය	වෙනත්
1	වතු ප්‍රජාව සඳහා ඉඩම් හිමිකම ලබාදීම	වතු ප්‍රජාව සඳහා ඉඩම් අයිතිය ලබාදීම තුලින් එම ප්‍රජාවගේ සමාජ පිළිගැනිම සහතික කිරීම	22.61	20.40	වාර්ෂික ඉලක්කය ඔප්පු 2445ක් සහ අත්පත්කර ගත් ප්‍රගතිය ඔප්පු 1083කි (44%)	මැතිවරණයන් ප්‍රකාශයට පත්වීම හා ඉඩම් නිදහස්කර ගැනිමේ ගැටළු හේතුවෙන් අපේක්ෂිත ප්‍රතිඵල ප්‍රමාද වීම.
2	වතු ප්‍රජාව සඳහා නිවාස සහ ඉඩම් ප්‍රතිපත්තියක් සකස් කිරීම	ඉඩම් හා නිවාස හිමිකම් නොමැති වතු පවුල් හඳුනාගනිමින් ඉඩම් හා නිවාස ලබාදීමේදී සිදුවිය හැකි දිවිකරණය වැලක්වීම	1.54	-	ජංගම දුරකථන මෘදුකාංගයක් හඳුන්වාදී ඇත. දත්ත සම්ක්ෂණය සම්බන්ධයෙන් පුහුණු කිරීම් ආරම්භ කර ඇත (මේ දක්වා අත්පත් කරගත් ප්‍රගතිය 40%)	මැතිවරණයන් ප්‍රකාශයට පත්වීම හේතුවෙන් හා අමාත්‍යාංශයෙන් නියමිත වේලාවට ප්‍රතිපාදන නොලැබීම මත පුහුණු කිරීම අවසන් කිරීම ප්‍රමාදවීම.

1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘති වල තොරතුරු

1.7.1 ඉන්දියානු ආධාර යටතේ ඉදිවන නිවාස ව්‍යාපෘතිය

මෙය අදියරයන් තුනක් යටතේ ක්‍රියාත්මක වන අතර පළමු අදියර (Stage 01) හා දෙවන අදියර (Stage 02) යටතේ නිවාස ඒකක 4,000 ක් 2016.01.08 දිනැති කැබිනට් අනුමැතිය මත ශ්‍රී ලංකාවේ ඉන්දීය මහ කොමසාරිස් කාර්යාලය සමග 2016.04.01 දින අත්සන් කරන ලද අවබෝධතා ගිවිසුම යටතේ ඉන්දියානු නිවාස වැඩසටහනේ පළමු අදියර හා දෙවන අදියර ඉන්දියානු මහා කොමසාරිස් කාර්යාලයේ සෘජු අධීක්ෂණය යටතේ ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය විසින් තෝරාගත් ආයතනයන් හතරක් මගින් සිදු කරනු ලබයි. මෙහි තෙවන අදියර (Stage 03) යටතේ නිවාස ඒකක 10,000 ක් ක්‍රියාත්මක කරනු ලබයි.

එක් නිවසක වටිනාකම රුපියල් මිලියනයක් ලෙසට ඇස්තමේන්තු ගත කර ඇති මෙම ව්‍යාපෘතියෙහි අදියර I සහ අදියර II සඳහා, නිවසක් වෙනුවෙන් ඉන්දියානු රජය විසින් රු: 2,800,000/= ක්ද, අදාල වැවිලි සමාගම විසින් රු: 75,000/= ක් හා ප්‍රතිලාභියා විසින් රු: 20,000 ක ශ්‍රම දායකත්වයක් සපයනු ලබයි. මෙම නිවාස ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය පානීය ජල පහසුකම්, විදුලිය, ප්‍රවේශ මාර්ග ඇතුළු අනෙකුත් යටිතල පහසුකම් සැපයීම වෙනුවෙන් ප්‍රථම අදියරයෙහි නිවාස සඳහා එක් නිවාස ඒකකයකට රු: 120,000/= ක් හා එහි දෙවන අදියර සඳහා එක් නිවසකට රු: 400,000/= ක් වන ලෙසට ශ්‍රී ලංකා රජය මගින් ප්‍රතිපාදන සපයනු ලැබේ.

ඉන්දියානු ආධාර යටතේ ඉදිවන නිවාස ව්‍යාපෘතිය

(අ) I පළමු හා II දෙවන අදියර (Stage I & II) - නිවාස 4000

(ආ) III - තෙවන අදියර (Stage III) - නිවාස10,000

III වන අදියර යටතේ ඉන්දීය රජය විසින් නව නිවාස 10,000 ක් වැවිලි ප්‍රජාව වෙත ලබා දීමට එකඟ වී ඇත. එයට අදාල අමාත්‍ය මණ්ඩල තීරණය 2018.08.16 දින ලැබී ඇති අතර ශ්‍රී ලංකාවේ ඉන්දීය මහ කොමසාරිස් කාර්යාලය සමග 2018.08.12 දින ඊට අදාල එකඟතා ගිවිසුමකට එළඹෙන ලදී. ඒ අනුව, බදුල්ල, හැටන්, නුවරඑළිය, නුවර, කෑගල්ල, රත්නපුර සහ ගාල්ල යන වතු කලාප හතේම වතු ප්‍රජාව සඳහා පියවර තුනකින් යුක්තව නිවාස ඒකක 10,000 ක් වතු ප්‍රතිලාභීන්ගේ මූලිකත්වයෙන් හා වතු සේවක සමුපකාර සමිති හරහා ඉදිකිරීමට සැළසුම් කර ඇත. මෙම ව්‍යාපෘතිය සඳහා යටතල පහසුකම් සැපයීම ශ්‍රී ලංකා රජයේ ආධාර හරහා සිදු කරනු ලබයි.

මෙම ව්‍යාපෘතියෙහි ප්‍රගතිය පහත පරිදි ඉදිරිපත් කළ හැක.

(අ) I පළමු හා II දෙවන අදියර (Stage I & II) - නිවාස 4000

- **නිවාස ඉදිකිරීම**

2024.12.31 දිනට සමස්ත භෞතික ප්‍රගතිය

ප්‍රතිලාභීන් වෙත භාරදුන් නිවාස සංඛ්‍යාව	3623
ප්‍රතිලාභීන් වෙත භාර දීමට නියමිත නිවාස සංඛ්‍යාව	377
යටිතල පහසුකම් පමණක් නිම කිරීමට ඇති නිවාස සංඛ්‍යාව -ජල පහසුකම් -විදුළි පහසුකම්	 100 70
නිම කළ මුළු නිවාස සංඛ්‍යාව	3972
නිවාස සහ යටිතල පහසුකම් නිම කර නොමැති සංඛ්‍යාව	28

2024.12.31 දිනට නිවාස ඉදිකිරීමේ මූල්‍ය ප්‍රගතිය - රු. මිලියන4324.44 (සමුච්චිත)

- **නිවාස සඳහා යටිතල පහසුකම් සැපයීම**

2024.01.01 සිට 2024.12.31 දක්වා යටිතල පහසුකම් සැපයීමේ මූල්‍ය ප්‍රගතිය

යටිතල පහසුකම්	වියදම රු මිලියන
ජලය	5.17
විදුලිය	1.20
මාර්ග	0.65
වැටුප් සහ අනෙකුත් වියදම්	9.73
මුළු වියදම	16.75

(ආ) III - තෙවන අදියර (Stage III) - නිවාස10,000

- **නිවාස ඉදිකිරීම**

2024.12.31 දිනට සමස්ත භෞතික ප්‍රගතිය

අත්තිවාරම් මට්ටමේ පවතින නිවාස සංඛ්‍යාව	40 (ඒකක)
බිත්ති මට්ටමේ පවතින නිවාස සංඛ්‍යාව	35 (ඒකක)
වහළ මට්ටමේ පවතින නිවාස සංඛ්‍යාව	18 (ඒකක)

2024.12.31 දිනට නිවාස ඉදිකිරීමේ මූල්‍ය ප්‍රගතිය - රු. මිලියන 496.69

- **නිවාස සඳහා යටිතල පහසුකම් සැපයීම**

2024.01.01 සිට 2024.12.31 දක්වා යටිතල පහසුකම් සැපයීමේ මූල්‍ය ප්‍රගතිය

යටිතල පහසුකම්	වියදම රු මිලියන
ජලය	0.05
විදුලිය	63.47
අනෙකුත්	1.87
මුළු වියදම	65.39

1.7.2 සංවර්ධන ප්‍රවේශය

ප්‍රාදේශීය ජන කණ්ඩායම් අතර පවතින සමාජ හා ආර්ථික විෂමතාවයන් අවම කරගත් සංවර්ධන ප්‍රවේශයන් ඔස්සේ රජයේ තිරසර සංවර්ධන අරමුණු අත්පත් කර ගැනීම උදෙසා අවශ්‍ය ප්‍රතිපත්ති සකස් කොට ක්‍රියාත්මක කිරීමේ අරමුණින් වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය යටතේ මෙම ප්‍රජා යටිතල පහසුකම් අංශය, වැවිලි ප්‍රදේශ කේන්ද්‍ර ගත කරගනිමින් ජීවත්වන පවුල් 250,000 ක පමණ (මිලියනයකට අධික ජනගහනයක් ඇති) වැවිලි ප්‍රජාව සඳහා ප්‍රජා සහභාගිත්වය හා රාජ්‍ය මැදිහත්වීම තුළින් වැවිලි ප්‍රජා නායකත්වය සහ සහභාගිත්වය දායක කරගනිමින් ඔවුන්ගේ ජීවන තත්ත්වය නගාසිටුවීමත්, වාසස්ථාන හා ඉඩම් පිළිබඳ ගැටලු, මූලික යටිතල පහසුකම් අවමවීම පිළිබඳ ගැටලු, අඩු ආදායම් තත්ත්වය සෞඛ්‍ය හා පෝෂණ ගැටලු අවම කිරීම සඳහා සක්‍රීය ලෙස දායක වෙමින් ඔවුන්ගේ අධ්‍යාපන, සමාජ හා ආර්ථික සංවර්ධන ඉලක්ක සපුරා ගැනීම සඳහා අවශ්‍ය රාජ්‍ය මැදිහත් වීමත් සිදුකරනු ලබයි.

එමගින් ප්‍රමුඛතාව ලබා දී ඇති නිවාස, පානීය ජලය හා සනීපාරක්ෂක පහසුකම් ඇතුළුව මූලික යටිතල පහසුකම් සංවර්ධනය, සෞඛ්‍ය හා පෝෂණය, මුල් ළමාවිය සංවර්ධනය හා ප්‍රාථමික අධ්‍යාපනය, වෘත්තීය පුහුණුව හා නිපුණතාවය, ප්‍රජාව සවිබල ගැන්වීම යනාදී ක්ෂේත්‍රයන් නියෝජනය කරනු ලබන කැබිනට් අමාත්‍යාංශයන්, අනෙකුත් රේඛීය අමාත්‍යාංශ හා පළාත් අමාත්‍යාංශයන් ඇතුළු සියලුම ආයතනයන්හි පූර්ණ දායකත්වය ලබාගනිමින් පහසුකම් සපිරි සෞභාග්‍යමත් වැවිලි ප්‍රජාවක් නිර්මාණය කිරීම සඳහා, මෙම අමාත්‍යාංශය පෙර ගමන්කරු වෙමින් සිටී.


1.7.3 ප්‍රජා යටිතල පහසුකම් අංශයේ සංවර්ධන ප්‍රමුඛතා

- වැවිලි ප්‍රජාව ආශ්‍රිතව නිවාස හා අඩු මහල් ප්‍රමාණයකින් යුත් නිවාස ඉදිකිරීම
- වැවිලි ප්‍රජාව ආශ්‍රිතව මූලික යටිතල පහසුකම් සංවර්ධනය
- වැවිලි ප්‍රජාවගේ ජීවනෝපාය සංවර්ධනය
- වැවිලි ප්‍රජාවගේ යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම.

1.7.4 සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ යාන්ත්‍රණය

- ප්‍රජා යටිතල පහසුකම් අංශය මගින් මෙහෙයවනු ලබන සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ කාර්යභාරය මූලික වශයෙන් වතු නිවාස අංශයේ විෂය පථය යටතේ ඇති ආයතන වන
- වැවිලි මානව සංවර්ධන භාරය
- සෞම්‍යාමූර්ති තොණ්ඩමාන් අනුස්මරණ පදනම
- වැවිලි කලාපය සඳහා වූ නව ගම්මාන අධිකාරිය හා ඊට අමතර වශයෙන්
- දිස්ත්‍රික් / ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා පළාත් පාලන ආයතන මගින් සිදු කරනු ලබයි

ප්‍රජා යටිතල පහසුකම් අංශයේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ යාන්ත්‍රණය



රූපය 1-7. ප්‍රජා යටිතල පහසුකම් අංශයේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ යාන්ත්‍රණය

පරිච්ඡේදය-02 ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2.1 විශේෂ ජයග්‍රහණ , අභියෝග හා ඉදිරි ඉලක්ක

2.1.1 වතු නිවාස වැඩසටහන

වාසස්ථාන සම්බන්ධයෙන් වන දර්ශක සැළකීමේදී ද වඩාත් පසුබෑමකට ලක්ව ඇති ජන කොට්ඨාසයක් ලෙස වැවිලි ප්‍රජාව සැලකිය හැකිය.වැවිලි ප්‍රජාව ජීවත් වන නිවාස වලින් අධික ප්‍රමාණයක් පේළි නිවාස වන අතර එම නිවාස ‘‘ලැයින් කාමර’’ වශයෙන් හඳුන්වනු ලබයි. මෙම නිවාසයන්හි වෙසෙන වැවිලි ප්‍රජාව ගැටලු රැසකට මුහුණ පා සිටී.

- නිවාස ඉතා පැරණි වීම නිසා අබලන් තත්ත්වයට පත්වීම.
- හිරු එළිය හා වාතාශ්‍රය අවමවීම.
- අධික තදබදය
- පෞද්ගලිකත්වයක් නොමැතිවීම.
- අනු පවුල් බිහිවීම නිසා පවුල් කිහිපයක් එකම නිවස තුළ ජීවත්වීම සහ ඒ හේතුවෙන් විවිධ අපචාරයන්ට ගොදුරුවීම.
- අනාරක්ෂිත බව.
- පිළිගැනීමක් නොමැති වීම.
- සෞඛ්‍යය සහ ළමුන්ගේ අධ්‍යාපනයට සුදුසු වටපිටාවක් නොමැති වීම.
- වැවිලි ක්ෂේත්‍රය තුළ මෙවැනි නිවාස වර්ග 3කි.

I. තනි බැරැක්ක

වර්ග අඩි 264කින් යුත් මෙම නිවස ඉදිරිපස ආලින්දයක් සහ තනි කාමරයකින් සමන්විතය.

II. යුගල බැරැක්ක

ඉදිරිපස ආලින්දයක් සහිත කාමර පේළි නිවාස වේ. එක් නිවසකට වර්ග අඩි 145-175ක් පමණ අයත් වේ. පේළියකට කාමර 10-12 ක් තිබිය හැකි අතර මෙම එක් බැරැක්කයක් ඉහත පරිදි සැකසුන පේළි 02කින් යුක්ත වේ.

III. තාවකාලික නිවාස

වැවිලි ක්ෂේත්‍රය තුළ ක්‍රමිකව පවුල් සංඛ්‍යාව වර්ධනය වීමත් සමග පවතින පේළි නිවාස ප්‍රමාණවත් නොවීම හේතුවෙන් එම නිවාස වලට යාබදව මෙම නිවාස ඉදිකර තිබේ. ටකරන් තහඩු සහ ඉටිරෙදි යොදා තනා ඇති මෙම නිවාස ඉතා අඩු පහසුකම් වලින් යුක්ත වේ.

වාසස්ථාන සම්බන්ධයෙන් වැවිලි ප්‍රජාව අත්විඳින්නා වූ මෙම දුෂ්කරතා මගහරවා අභිමානයකින් යුතුව ජීවත්වීමේ අයිතිය වැවිලි ප්‍රජාව වෙතද හිමිකරදීමේ අදිටනින්, වතු නිවාස යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කරනු ලබයි.

මේ යටතේ ඉඩම් ඔප්පු හිමිකම සහිත පර්චස් 07ක බිම් අයිතියද සමග සෞඛ්‍යාරක්ෂිත පානීය ජලය, විදුලිය හා සංවර්ධනය කරන ලද ප්‍රවේශ මාර්ග ආදී යටිතල පහසුකම්ද සහිතව වර්ග අඩි 550කින් සමන්විත යාබද වැසිකිළි සහිත තනි නිවාසයක් ලබාදීම සිදුකරන ලදී. මීට අමතරව සත්ත්ව පාලනය සහ ගෙවතු වගාවන් පවත්වා ගැනීමට හැකි වන ලෙස අමතර පර්චස් 03ක් ලබා දීමට ද 2021 ජනවාරි මාසයේදී අමාත්‍ය මණ්ඩල අනුමැතිය හිමි වී තිබීම විශේෂ වේ. (අංක: MUD&H/2021/CP/06 දරණ 2021.01.07 දරණ අමාත්‍ය මණ්ඩල සංදේශය)

වගුව2-1. 2024.12.31 දිනට නිවාස වැඩසටහනෙහි සමස්ත ප්‍රගතිය (රජයේ ප්‍රතිපාදන මත ක්‍රියාත්මක වූ නිවාස වැඩසටහනක්)

ව්‍යාපෘතිය	කාර්යයන්	**2024** වර්ෂය සඳහා ප්‍රතිපාදන (රුම්ලියන)	**2024** වර්ෂයේ වියදම (රුම්ලියන)	භෞතික ප්‍රගතිය
අඩක් නිමකළ නිවාස සම්පූර්ණ කිරීම	යටිතල පහසුකම් සහිතව නිවාස 377ක් සම්පූර්ණ කිරීම සහ ප්‍රතිලාභීන් වෙත භාරදීම.	350.60	299.15	නිවාස 377ක ඉදිකිරීම් කටයුතු සම්පූර්ණ කිරීම. විදුලි ව්‍යාපෘති 3ක් සම්පූර්ණ කිරීම. ජල ව්‍යාපෘති 01ක් සම්පූර්ණ කිරීම
	2023 නිවාස ව්‍යාපෘති ඉදිරියට ගෙන යාම (අතැති බිල්පත්)	68.64	62.90	-
නිවාස සඳහා යටිතල පහසුකම් සැපයීම	2023 නිවාස යටිතල පහසුකම් සඳහා වන අතැති බිල්පත්	33.78	33.55	-
	2023 නිවාස යටිතල පහසුකම් අඛණ්ඩව පවත්වාගෙන යාම	46.98	31.46	ජල ව්‍යාපෘති 09ක් සම්පූර්ණ කිරීම විදුලි ව්‍යාපෘති 1ක් සම්පූර්ණ කිරීම.
එකතුව		**500.00**	**427.06**	

2.1.2 යටිතල පහසුකම් සංවර්ධනය

වැවිලි ප්‍රදේශයන්හි පවතින යටිතල පහසුකම් අවශ්‍යතා හඳුනාගනිමින් ඒ සඳහා සුදුසු ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම මේ යටතේ සිදු වේ. ඒ අනුව එම ජනතාව දැනට මුහුණ පා ඇති,

- ආරක්ෂිත පානීය ජලය පිළිබඳ ගැටලු
- සනීපාරක්ෂක පහසුකම් පිළිබඳ ගැටලු
- ගමනාගමන දුෂ්කරතා පිළිබඳ පිළිබඳ ගැටලු
- ආගමික හා සංස්කෘතික පහසුකම් නොමැති වීම පිළිබඳ ගැටලු
- ළමා සංවර්ධන මධ්‍යස්ථාන හා අධ්‍යාපනික පහසුකම් නොමැතිවීම පිළිබඳ ගැටලු

ක්‍රීඩා පහසුකම් හා අනෙකුත් පොදු පහසුකම් අවශ්‍යතා සැපයීම සඳහා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම මෙන්ම ආපදා තත්ත්ව වලදී වැවිලි ප්‍රජාව සඳහා සහන සැලසීම වැනි ව්‍යාපෘතීන්ද මේ යටතේ සිදුකරයි. මෙම අංශය යටතේ පවතින වැවිලි මානව සංවර්ධන භාරයට අයත් ප්‍රාදේශීය කාර්යාලයන් හරහා සහ එයට අමතරව දිස්ත්‍රික්/ ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා පළාත් පාලන ආයතන මගින්ද එම ප්‍රජාව වෙනුවෙන් අමාත්‍යාංශ ප්‍රතිපාදන යටතේ යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාවට නැංවීම සිදුකරයි.

වගුව 2-2. 2024 වර්ෂයේදී සම්පූර්ණ කරන ලද යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතින්හි ප්‍රගතියෙහි සාරාංශය

ව්‍යාපෘතිය	වාර්ෂික ප්‍රතිපාදන (වාර්ෂික සැලැස්මට අනුව) රු. මි.	2024.12.31 දිනට වෙන් කළ ප්‍රතිපාදන ප්‍රමාණය රු. මි.	2024.12.31 දිනට තත්‍ය වියදම රු. මි.	ක්‍රියාත්මක වෙමින් පවතින ව්‍යාපෘති සංඛ්‍යාව	සම්පූර්ණ කළ ව්‍යාපෘති සංඛ්‍යාව
01) යටිතල පහසුකම් සංවර්ධනය (රු **100** මිලියන)					
1.1)වතු තරුණ තරුණියන්ට විරැකියාවෙන් මිදීම සඳහා වෘත්තීය පුහුණුව ලබාදීම * පාඨමාලා සඳහා ආහාර *පාඨමාලා ද්‍රව්‍ය * NVQ පුහුණුවන්නන් සඳහා ඇගයීම්	21.00	21.00	13.89	-	ප්‍රතිලාභීන් 208ක් පුහුණුව සම්පූර්ණ කර ඇත.
1.2) 2023 අතැති බිල්පත්	2.58	2.58	3.69	-	-
1.3) 2023 යටිතල පහසුකම් අඛණ්ඩ ව්‍යාපෘති	2.18	2.18			
1.4) පානීය ජල පහසුකම් සහ සනීපාරක්ෂක පහසුකම් නොමැති ලයින් නිවාස සහ වතුකරයේ පාසල් සඳහා පිරිසිදු පානීය ජලය සහ සනීපාරක්ෂක පහසුකම් ලබාදීම. (ව්‍යාපෘති 10)	8.44	8.44	0.37	-	ජල ව්‍යාපෘති 1ක් සම්පූර්ණ කර ඇත.
1.5)වතු ජනතාව සඳහා ආගමික හා සංස්කෘතික පහසුකම් සහතික කිරීම (105 මධ්‍යස්ථාන)	32.00	32.00	28.44	-	ආගමික හා සංස්කෘතික ව්‍යාපෘති 97ක් සම්පූර්ණ කිරීම.
1.6) විශේෂ අවශ්‍යතා (ව්‍යාපෘති 10)					
1.6.1) ආපදාවලින් විපතට පත් වතු ජනතාවට සහන සේවා සැපයීම	6.00	6.00	0.83	-	ලයින් කාමර සඳහා වහළ සෙවිළි කිරීමේ එක් ව්‍යාපෘතියක් සම්පූර්ණ කර ඇත.
1.6.2) මාර්ගය	5.00	5.00	-	-	-
1.63) ක්‍රීඩා ක්‍රියාකාරකම්, ක්‍රීඩා පිටි සහ පාසල් සංවර්ධනය	15.50	15.50	2.77	-	ක්‍රීඩා සමාජ 48 කට පාපන්දු බෙදා හැරීම ව්‍යාපෘතිය අවසන් කර ඇත.

					සමනල පෙර පාසල් ආරක්ෂක වැට ලබාදීමේ ව්‍යාපෘතිය අවසන් කර ඇත. ශාන්ත ෆ්‍රැන්සිස් දෙමළ විදුහලේ වහල ප්‍රතිසංස්කරණය කිරීම.
1.6.4) හැඳුනුම්පත් උප්පැන්න සහතික නිකුත් කිරීම	0.30	0.30	0.15	-	ගාල්ල සහ කළුතර දිස්ත්‍රික්කයේ වැඩසටහන් 2 ක් අවසන් කර ඇත. (ප්‍රතිලාභීන් 139)
1.7)ප්‍රජා සවිබල ගැන්වීම සහ ජීවනෝපාය සංවර්ධනය රැකියා විරහිත වතු ජනතාවට ස්වයං රැකියා සඳහා පහසුකම් සැලසීම (පවුල් 25ක් සඳහා) *එළුවන් ලබාදීම. *කුකුළන් ලබාදීම	5.00	5.00	4.71	-	එළු අභිජනන සංවර්ධන නියමු ව්‍යාපෘතිය අවසන් කර ඇත.
1.8)වැවිලි අංශයේ සියලුම ප්‍රතිලාභීන් සඳහා දත්ත සමීක්ෂණය	2.00	2.00	-	-	-
එකතුව	**100.00**	**100.00**	**54.85**	**-**	**-**
රු බිලියන 2 වැඩසටහන (වැවිලි අංශයේ යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති)					
2.1) වැවිලි ප්‍රජාව සඳහා ආගමික සහ සංස්කෘතික පහසුකම් ලබා දීම.	487.00	487.00	80.17	-	ආගමික ව්‍යාපෘති 115ක් සම්පූර්ණ කිරීම .
2.2) පිරිසිදු පානීය ජල සැපයුම්, විදුලි සැපයුම් සහ සනීපාරක්ෂණ පහසුකම් නොමැති ලයින් කාමර සහ වතු පාසල් සඳහා එම පහසුකම් ලබා දීම.	152.00	152.00	56.51	-	ජල ව්‍යාපෘති 11 2ක් සම්පූර්ණ කර ඇත. අනෙකුත්

					ව්‍යාපෘති සිදු කරමින් පවතී. –ව්‍යාපෘති 3- 95% සම්පූර්ණ කර ඇත –ව්‍යාපෘති 3- 75% සම්පූර්ණ කර ඇත
2.3) වතුකරයේ ආපදාවට ලක්වූ ජනතාව සඳහා සෙවිලි තහඩු සැපයීම සහ සවි කිරීම	158.00	158.00	5.69	-	ලයින් කාමර3ක් සඳහා සෙවිළි තහඩු ලබා දී ඇත.
2.4) පාසල් සංවර්ධනය					
2.4.1) වතුකරයේ පාසල් සඳහා පන්ති කාමර පහසුකම් සැපයීම	257.72	257.72	-	-	-
2.4.2) STEM ගුරු පුහුණුව	24.94	24.94	22.32	-	STEM ගුරු පුහුණුව සම්පූර්ණ කර ඇත. (ප්‍රතිලාභීන්- 2122)
2.4.3)පාසල් සඳහා තාක්ෂණික ඉගැන්වීම් උපකරණ ලබා දීම.	129.84	129.84	-	-	-
2.4.4)පාසල් සංවර්ධන ව්‍යාපෘති	19.98	19.98	7.37	-	පාසල් ව්‍යාපෘති 8ක් සම්පූර්ණ කර ඇත.
2.5) ක්‍රීඩා සංවර්ධනය					
2.5.1) ක්‍රීඩා පිටි සංවර්ධනය	111.60	111.60	2.44	-	ව්‍යාපෘති 3ක් සම්පූර්ණ කර ඇත.
2.5.2)ක්‍රීඩා සමාජ සඳහා ක්‍රීඩා උපකරණ ලබාදීම	39.41	39.41	-	-	-
2.6)මාර්ග, පාලම් සංවර්ධනය	479.00	479.00	47.37	-	මාර්ග සහ පාලම් 76ක් සම්පූර්ණ කර ඇත
2.7) පොදු පහසුකම්	58.00	28.00	12.98	-	පොදු පහසුකම් ව්‍යාපෘති 8ක් සම්පූර්ණ කර ඇත.
2.8)වතුකරයේ ජනතාවගේ සෞඛ්‍ය තත්ත්වය ඉහළ	40.00	40.00	-	-	-

නැංවීම සඳහා සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම (සනීපාරක්ෂක හා මාතෘ කට්ටල ලබාදීම)					
2.9) ප්‍රජා සවිබල ගැන්වීම සහ ජීවනෝපාය සංවර්ධනය					
2.9.1 තරුණ සමූළුව	3.14	3.14	3.13	-	සම්පූර්ණ කර ඇත.
2.9.2 ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘති	38.40	38.40	-	-	-
2.10 හිමිකම් ඔප්පු ප්‍රදානය කිරීම	22.60	22.60	20.53	-	-හිමිකම් ඔප්පු 1081 සකස් කර ඇත.
එකතුව	**2021.63**	**2021.63**	**258.51**	**-**	**-**

2024 වර්ෂය තුළ ක්‍රියාත්මක කරන ලද යටිතල පහසුකම් සංවර්ධනය ව්‍යාපෘති සම්බන්ධ තොරතුරු

- **වතු තරුණ තරුණියන්ට විරැකියාවෙන් මිදීම සඳහා වෘත්තීය පුහුණුව ලබාදීම**

TVTC හැටන් විසින් සිසුන්ට වෘත්තීය පුහුණුව ලබා දෙන අතර ඔවුන්ගේ ජීවනෝපාය සඳහා කුසලතා වැඩි දියුණු කිරීම සඳහා ගැහැණු සහ පිරිමි ලෙස වෙනම නේවාසිකාගාර, නවීන උපකරණ සහිත ශාලා පහසුකම් ඇතුළු අමතර පහසුකම් සපයයි. සියලුම පුහුණුකරුවන් සඳහා ආහාර සහ නවාතැන් පහසුකම් නොමිලේ සපයනු ලැබේ. TVTC හි පුහුණුකරුවන් සඳහා පාඨමාලා සම්පූර්ණ කිරීම සඳහා NVQ ඇගයීම් හරහා NVQ සහතිකය ලබා දෙනු ලැබේ.

- **පානීය ජල පහසුකම් සහ සනීපාරක්ෂක පහසුකම් නොමැති ලයින් නිවාස සහ වතුකරයේ පාසල් සඳහා පිරිසිදු පානීය ජලය සහ සනීපාරක්ෂක පහසුකම් ලබාදීම.**

ජල උල්පත් ආශ්‍රිත කඳුකර ප්‍රදේශවල ජීවත් වන වැවිලි ප්‍රජාව වෙත සෞඛ්‍යාරක්ෂිත පානීය ජලය ලබාගැනීමට නොහැකි වීම ප්‍රධාන ගැටලුවකි. එම අවධානමෙන් ජනතාව මුදවා ගැනීමේ අරමුණින් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වේ. 2024 වර්ෂයේදී සෞඛ්‍යාරක්ෂිත පානීය ජල ව්‍යාපෘති සිදුකර ඇත. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය හා එක්ව වැවිලි මානව සංවර්ධන භාරය විසින් ප්‍රජා යටිතල පහසුකම් අංශය මගින් ලබාදෙන නව නිවාස සඳහාද සෞඛ්‍යාරක්ෂිත පානීය ජල පහසුකම් ලබාදීමට කටයුතු කරයි.

වැවිලි ප්‍රජාවගෙන් බොහෝ පිරිසකට සනීපාරක්ෂක පහසුකම් අවම වීමේ ගැටලුවට මුහුණ පා සිටී. ඒ අනුව ඉදි කරනු ලබන නව නිවාස සඳහා ජල පහසුකම් සහිත නව වැසිකිළියක් සහ ලැයින් කාමර වැසියන් සඳහා අවශ්‍යතාවය මත නව වැසිකිළි ලබාදීම සිදුකරයි.

- **වතු ජනතාව සඳහා ආගමික හා සංස්කෘතික පහසුකම් සහතික කිරීම**

වතු ප්‍රජාව යනු ආගමික සහ සංස්කෘතික කටයුතු සඳහා ඉතා ලැදියාවක් දක්වන ජන කොට්ඨාශයකි. ඔවුන් සිය එදිනෙදා ජීවන කටයුතු වලදී කෝවිල්, පන්සල්, පල්ලි, දේවස්ථාන යන ආගමික ස්ථානවල වන්දනාමාන කටයුතු කෙරෙහි නිරන්තරයෙන් යෙදෙන අතර සමාජ සංහිඳියාව සහ ප්‍රජා සමඟිය සඳහාද එය මනා පිටුවහලක් වේ. ඒ අනුව, වැවිලි ප්‍රජාවගේ ආගමික සහ සංස්කෘතික සංවර්ධනය උදෙසා ආගමික ස්ථාන වල අත්‍යවශ්‍ය සංවර්ධන කටයුතු සිදු කිරීම මෙම ව්‍යාපෘතිය මඟින් සිදු කෙරුණි.

- **ආපදාවලින් විපතට පත් වතු ජනතාවට සහන සේවා සැපයීම**

ආපදාවට ලක් වූ වතු ජනතාව සඳහා සහන සේවාවන් සැළසීම සැපයීම මෙම ව්‍යාපෘතිය යටතේ සිදු කරන ලද අතර 2024 වර්ෂයේදී විපතට පත් වූ ජනතාව සඳහා සෙවිළි තහඩු ලබා දීමේ ව්‍යාපෘතියක් සිදු කරන ලදී.

- **ප්‍රජා සවිබල ගැන්වීම සහ ජීවනෝපාය සංවර්ධනය රැකියා විරහිත වතු ජනතාවට ස්වයං රැකියා සඳහා පහසුකම් සැලසීම (පවුල් 25ක් සඳහා)**

සෞම්‍යාමූර්ති තොණ්ඩමාන් ආයතනය මඟින් අමාත්‍යාංශ ප්‍රතිපාදන යටතේ වතුකරයේ තෝරාගත් ප්‍රතිලාභීන් 25 දෙනෙකු වෙත 2024.04.06 දින එළුවන් බෙදාදෙනු ලැබීය. . මෙම ව්‍යාපෘතියේ අරමුණ වන්නේ වතු ජනතාවගෙන් රැකියා විරහිතව පසුවන පුද්ගලයන්ට ස්වයං රැකියා අවස්ථා සැලසීම හරහා ඔවුන්ගේ ආර්ථිකය ශක්තිමත් කර ජීවන තත්ත්වය උසස් කිරීමයි. එළුවන් බෙදාදීමෙන් ඔවුන්ට කර්මාන්තයක නිරත විය හැකි වන අතර, දිගුකාලීනව ආදායම් මාර්ගයක් බිහි කිරීමේ හැකියාවද ඇතිවෙයි. මෙය වතුකර ප්‍රජාවගේ සවිබල ගැන්වීම හා තිරසාර සංවර්ධනය සඳහා අත්‍යවශ්ය පියවරක් ලෙස සැලකිය හැක.

- **ක්‍රීඩා ක්‍රියාකාරකම්, ක්‍රීඩා පිටි සහ පාසල් සංවර්ධනය**

මෙම ව්‍යාපෘතිය යටතේ ක්‍රීඩා සමාජ 48කට පාපන්දු බෙදාදීමේ කටයුතු සාර්ථකව අවසන් කර ඇත. මෙය තරුණයින්ගේ සමාජ සහභාගිත්වය වර්ධනය කිරීම සඳහා මූලික පියවරක් ලෙස හඳුනාගත හැක. එමෙන්ම, සමනල පෙර පාසලට ආරක්ෂක වැටක් ලබාදීමත්, එහි දරුවන්ට ආරක්ෂිත පරිසරයක් උදා කිරීම සඳහා කෙරුණු වැදගත් මෙහෙවරක් වන අතර, ශාන්ත ෆ්‍රැන්සිස් දෙමළ විදුහලේ වහලය ප්‍රතිසංස්කරණය කිරීමද සිසුන්ට වඩා සුදුසු ඉගෙනුම් පරිසරයක් උදා කිරීමේ අරමුණින් සිදු කරන ලදී. මෙම ව්‍යාපෘති සියල්ලම දරුවන්ගේ සමාජ, මානසික හා බුද්ධිමය වර්ධනයට සහය වන අයුරින් ක්‍රියාත්මක කර ඇත.

- **හැඳුනුම්පත් උප්පැන්න සහතික නිකුත් කිරීම**

හැඳුනුම්පත් සහ උප්පැන්න සහතික නිකුත් කිරීමේ වැඩසටහන යටතේ, ගාල්ල සහ කළුතර දිස්ත්‍රික්කයන්හි වැඩසටහන් 2 ක් සාර්ථකව ක්‍රියාත්මක කර අවසන් කර ඇත. මෙහිදී මුළු ප්‍රතිලාභීන් 139 දෙනෙකුට අවශ්‍ය ලේඛන නිකුත් කිරීම සිදුකරන ලදී. මෙම වැඩසටහන අයදුම්කරුවන්ගේ නීතිමය අනන්‍යතාවය සනාථ කිරීම සහ රාජ්‍ය සේවාවන් වෙත පහසුවෙන් පිවිසීමේ අවස්ථාව ලබාදීමේ අරමුණින් ක්‍රියාත්මක විය.

- **STEM ගුරු පුහුණුව**

STEM (විද්‍යාව, තාක්ෂණය, ඉංජිනේරු විද්‍යාව සහ ගණිතය) ගුරු පුහුණුව වැඩසටහන සාර්ථකව සම්පූර්ණ කර ඇත. මෙම වැඩසටහන යටතේ ගුරුවරුන් 2,122 ප්‍රතිලාභීන් ලෙස හඳුනාගන්නා ලදී. පුහුණු වැඩසටහනේ ප්‍රධාන අරමුණ වන්නේ ගුරුවරුන්ගේ විෂය දැනුම සහ ඉගැන්වීමේ කුසලතා වර්ධනය කිරීමයි. මෙය සිසුන්ගේ STEM අධ්‍යාපනය තත්ත්වය වැඩිදියුණු කිරීමේ වැදගත් පියවරක් ලෙස සැලකේ. වැඩසටහන තුළ නව ඉගැන්වීම් විධිමත් ක්‍රම, උදාහරණ සහ තාක්ෂණික මෙවලම් භාවිතය පිළිබඳ පුහුණු කිරීමද සිදු විය.

- **තරුණ සමුළුව**

NAAM 200 වැඩසටහනට (වතු ප්‍රජාව ශ්‍රී ලංකාවට පැමිණ වසර 200 ක් සැමරීමේ අවස්ථාව) සමගාමීව තරුණ සමුළුවක්, ශ්‍රී ලංකාවේ වතුකරයේ සහ අනෙකුත් ප්‍රජාවන්හි සහස්‍රක සහ තරුණ තරුණියන් ඉලක්ක කරගෙන පැවති අතර එය වතුකරයේ තරුණ ජනතාවගේ ආර්ථිකය හා අධ්‍යාපන අවස්ථාවන්හි පවතින හිඩැස පිරවීමටත් අනෙකුත් තරුණ ප්‍රජාව සමඟ සම්බන්ධ වීම තුළින් ශ්‍රී ලාංකීය සමාජය ඒකාබද්ධ කිරීමත් අරමුණු කර ගෙන සිදුකරන ලදී. මෙම වැඩසටහන 2024 ජුනි 22 වන දින SLIIT මහනුවර (ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය)හිදී 450 කට අධික පිරිසක් සහභාගීත්වයෙන් වූ එක්දින තරුණ සමුළුවක් විය.

- **හිමිකම් ඔප්පු ප්‍රදානය කිරීම**

හිමිකම් ඔප්පු ප්‍රදානය කිරීමෙන් පුද්ගලයන්ට නීතිමය අයිතියක් ලැබේ. විශේෂයෙන්ම, ඔප්පු ප්‍රදානය කිරීම වතු කම්කරුවන්ගේ ජීවන තත්ත්වය උසස් කිරීම සඳහා ක්‍රියාත්මක වේ. ඔවුන්ගේ නිවෙස් පිහිටි ඉඩම් සම්බන්ධයෙන් නීතිමය අයිතිය ලබාදී, සමාජ ආරක්ෂාව, අධ්‍යාපනික හා ආර්ථික වාසියන් ලබාදීම මෙහි අරමුණ වේ.

වගුව 2-3. 2024 වර්ෂය තුළ ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතීන්හි භෞතික ප්‍රගතිය

2024 ඉලක්කය **(වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව)**	**2024.12.31 දිනට ප්‍රගතිය**	**භෞතික ප්‍රගතිය %**
01)ඉන්දියානු ආධාර යටතේ ඉදිකරනු ලබන නිවාස 4000 වැඩසටහන		
1.1) ඉන්දියානු ආධාර යටතේ ඉදිකරනු ලබන නිවාස 4000 වැඩසටහන	නිවාස 110ක් සම්පූර්ණ කර ඇත.	79.71%
1.2) ඉන්දියානු ආධාර යටතේ ඉදිකරනු ලබන නිවාස 4000 වැඩසටහන	නිවාස ඒකක 80ක් සඳහා විදුලි පහසුකම් ලබාදීම සහ ඉතිරි නිවාස 70 සඳහා ගෙවීම් සිදු කර ඇත. නිවාස ඒකක 500ක් සඳහා ජල පහසුකම් ලබාදීම	40%
02) ඉන්දියානු ආධාර යටතේ ඉදිකරනු ලබන නිවාස 10000 වැඩසටහන		
2.1) 10000 නිවාස වැඩසටහන නිවාස ඒකක 200 ක් සම්පූර්ණ කිරීම	අත්තිවාරම් මට්ටමට සම්පූර්ණ කළ නිවාස- ඒකක 406 බිත්ති මට්ටමට සම්පූර්ණ කළ නිවාස- ඒකක 35 වහළ මට්ටමට සම්පූර්ණ කළ නිවාස- ඒකක 18 ඉදිකිරීම් අවසන් කළ නිවාස- ඒකක 5	10%
2.2) 10000 නිවාස වැඩසටහන නිවාස ඒකක 200ක් සඳහා යටිතල පහසුකම් ලබාදීම		
03) නුවරඑළිය, බදුල්ල සහ මහනුවර වතු පාසල් 60ක සුහුරු පන්ති කාමර ස්ථාපිත කිරීම		
3.1) නුවරඑළිය, බදුල්ල සහ මහනුවර වතු පාසල් 60ක සුහුරු පන්ති කාමර ස්ථාපිත කිරීමට අදාලව අවශ්‍ය උපකරණ ලබාදීම (ඉන්දියානු ආධාර)	පාසල් 60 සඳහා උපකරණ ලබාදීම	අවබෝධතා ගිවිසුම අත්සන් කිරීමට ප්‍රථම කැබිනට් මණ්ඩල සටහනක් අමාත්‍ය මණ්ඩල කාර්යාලය වෙත ඉදිරිපත් කර ඇත.
3.2) නුවරඑළිය, බදුල්ල සහ මහනුවර වතු පාසල් 60ක සුහුරු පන්ති කාමර ස්ථාපිත කිරීමට අදාලව එම තෝරාගත් පාසල් වල ප්‍රතිසංස්කරණ කටයුතු කිරීම (ශ්‍රී ලංකා රජයේ ප්‍රතිපාදන)	පාසල් 60 ප්‍රතිසංස්කරණය කිරීම	

04) වතු නිවාස වැඩසටහන		
4.1) අඩක් නිමකළ නිවාස සම්පූර්ණ කිරීම		
4.1.1)යටිතල පහසුකම් සහිතව නිවාස 377ක් සම්පූර්ණ කිරීම සහ ප්‍රතිලාභීන් වෙත භාරදීම.	නිවාස 377ක ඉදිකිරීම් සම්පූර්ණ කර ඇත	100%
4.1.2)2023 නිවාස ව්‍යාපෘති ඉදිරියට ගෙන යාම (අතැති බිල්පත්)		
4.2) නිවාස සඳහා යටිතල පහසුකම් සැපයීම		
4.2.1) 2023 නිවාස යටිතල පහසුකම් සඳහා වන අතැති බිල්පත්		
4.2.2)2023 නිවාස යටිතල පහසුකම් අඛණ්ඩව පවත්වාගෙන යාම		
05) යටිතල පහසුකම් සංවර්ධනය (රු 100 මිලියන)		
5.1)වතු තරුණ තරුණියන්ට විරැකියාවෙන් මිදීම සඳහා වෘත්තිය පුහුණුව ලබාදීම * පාඨමාලා සඳහා ආහාර *පාඨමාලා ද්‍රව්‍ය * NVQ පුහුණුවන්නන් සඳහා ඇගයීම්	ප්‍රතිලාභීන් 208ක් පුහුණුව සම්පූර්ණ කර ඇත.	59%
5.2) 2023 අතැති බිල්පත්	-	-
2023 යටිතල පහසුකම් අඛණ්ඩ ව්‍යාපෘති		
5.3) පානීය ජල පහසුකම් සහ සනීපාරක්ෂක පහසුකම් නොමැති ලයින් නිවාස සහ වතුකරයේ පාසල් සඳහා පිරිසිදු පානීය ජලය සහ සනීපාරක්ෂක පහසුකම් ලබාදීම.(ව්‍යාපෘති 10)	ජල ව්‍යාපෘති 1ක් සම්පූර්ණ කර ඇත.	10%
5.4)වතු ජනතාව සඳහා ආගමික හා සංස්කෘතික පහසුකම් සහතික කිරීම (මධ්‍යස්ථාන- 105)	ආගමික හා සංස්කෘතික ව්‍යාපෘති 97ක් සම්පූර්ණ කිරීම.	92%
5.5) විශේෂ අවශ්‍යතා (ව්‍යාපෘති 10)		
5.5.1) ආපදාවලින් විපතට පත් වතු ජනතාවට සහන සේවා සැපයීම	ලයින් කාමර සඳහා වහළ සෙවිළි කිරීමේ එක් ව්‍යාපෘතියක් සම්පූර්ණ කර ඇත.	40%
5.5.2) මාර්ගය	-	
5.5.3) ක්‍රීඩා ක්‍රියාකාරකම්, ක්‍රීඩා පිටි සහ පාසල් සංවර්ධනය	සමාජ ශාලා 48 කට පාපන්දු පාර බෙදා හැරීම ව්‍යාපෘතිය අවසන් කර ඇත. සමනල පෙර පාසල් ආරක්ෂක වැට ලබාදීමේ ව්‍යාපෘතිය අවසන් කර ඇත. ශාන්ත ෆ්‍රැන්සිස් දෙමළ විදුහලේ වහල ප්‍රතිසංස්කරණය කිරීම.	
5.5.4) හැඳුනුම්පත් උප්පැන්න සහතික නිකුත් කිරීම	ගාල්ල සහ කළුතර දිස්ත්‍රික්කයේ වැඩසටහන් 2 ක් අවසන් කර ඇත. (ප්‍රතිලාභීන් 139)	
5.6)ප්‍රජා සවිබල ගැන්වීම සහ ජීවනෝපාය සංවර්ධනය රැකියා විරහිත වතු ජනතාවට ස්වයං රැකියා සඳහා පහසුකම් සැලසීම (පවුල් 25ක් සඳහා) *එළුවන් ලබාදීම.	එළු අභිජනන සංවර්ධන නියමු ව්‍යාපෘතිය අවසන් කර ඇත.	90%

*කුකුළන් ලබාදීම		
5.7) වැවිලි අංශයේ සියලුම ප්‍රතිලාභීන් සඳහා දත්ත සමීක්ෂණය	-	0%
06) රු බිලියන 2 වැඩසටහන (වැවිලි අංශයේ යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති)		
6.1) වැවිලි ප්‍රජාව සඳහා ආගමික සහ සංස්කෘතික පහසුකම් ලබා දීම. (595)	ආගමික ව්‍යාපෘති 115ක් සම්පූර්ණ කිරීම .	19%
6.2) පිරිසිදු පානීය ජල සැපයුම්, විදුලි සැපයුම් සහ සනීපාරක්ෂණ පහසුකම් නොමැති ලයින් කාමර සහ වතු පාසල් සඳහා එම පහසුකම් ලබා දීම. -වතු නිවාස සඳහා ජල සැපයුම් ලබාදීම -ජල සැපයුම් ව්‍යාපෘති 15ක් සම්පූර්ණ කිරීම -සනීපාරක්ෂණ පහසුකම් ව්‍යාපෘති 2ක් සම්පූර්ණ කිරීම -විදුලි පහසුකම් සැපයීම	ජල ව්‍යාපෘති 2ක් සම්පූර්ණ කර ඇත. (ව්‍යාපෘති 3-95% සම්පූර්ණ කර ඇත, ව්‍යාපෘති 3-75% සම්පූර්ණ කර ඇත -වැසිකිළි 7ක ඉදිකිරීම් සම්පූර්ණ කර ඇත.	15%
6.3) වතුකරයේ ආපදාවට ලක්වූ ජනතාව සඳහා සෙවිලි තහඩු සැපයීම සහ සවි කිරීම - සෙවිලි තහඩු 8500ක් ලබාදීම් - ලයින් කාමර3ක් සඳහා සෙවිළි තහඩු ලබා දී ඇත.	ලයින් කාමර3ක් සඳහා සෙවිළි තහඩු ලබා දී ඇත.	10%
6.4) පාසල් සංවර්ධනය	-	-
6.4.1) වතුකරයේ පාසල් සඳහා පන්ති කාමර පහසුකම් සැපයීම (පාසල් 24)	-	0%
6.4.2) STEM ගුරු පුහුණුව (ප්‍රතිලාභීන් -2400)	STEM ගුරු පුහුණුව සම්පූර්ණ කර ඇත. (ප්‍රතිලාභීන් -2122)	100%
6.4.3)පාසල් සඳහා තාක්ෂණික ඉගැන්වීම් උපකරණ ලබා දීම. (පාසල් 412)	-	0%
6.4.4)පාසල් සංවර්ධන ව්‍යාපෘති (පාසල් 24)	පාසල් ව්‍යාපෘති 8ක් සම්පූර්ණ කර ඇත.	33%
6.5) ක්‍රීඩා සංවර්ධනය		
6.5.1) ක්‍රීඩා පිටි සංවර්ධනය (ව්‍යාපෘති 73)	ව්‍යාපෘති 3ක් සම්පූර්ණ කර ඇත.	4%
6.5.2) ක්‍රීඩා සමාජය සඳහා ක්‍රීඩා උපකරණ ලබාදීම (ක්‍රීඩා සමාජ 1351)	-	0%
6.6) මාර්ග, පාලම් සංවර්ධනය ව්‍යාපෘති - 396	මාර්ග සහ පාලම් 76ක් සම්පූර්ණ කර ඇත	19%
6.7) පොදු පහසුකම් ව්‍යාපෘති - 73	පොදු පහසුකම් ව්‍යාපෘති 8ක් සම්පූර්ණ කර ඇත.	11%
6.8)වතුකරයේ ජනතාවගේ සෞඛ්‍යය තත්ත්වය ඉහළ නැංවීම සඳහා සෞඛ්‍යය ප්‍රවර්ධනය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම (සනීපාරක්ෂක කට්ටල 2000 හා මාතෘ කට්ටල 1000 ලබාදීම)	-	0%

6.9) ප්‍රජා සවිබල ගැන්වීම සහ ජීවනෝපාය සංවර්ධනය		
6.9.1 තරුණ සමුළුව	සම්පූර්ණ කර ඇත.	100%
6.9.2 ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘති ව්‍යාපෘති -4	-	0%
6.10 හිමිකම් ඔප්පු ප්‍රදානය කිරීම - වතු පවුල් සඳහා නිවාස 2000 ක නිරවුල් ඔප්පු අංකයක් සහිත ඉඩම් අයිතිය සහතික කිරීම	-හිමිකම් ඔප්පු 1081 සකස් කර ඇත. - හිමිකම් ඔප්පු 716ක් ලබාදී ඇත	36%

වගුව 2-4. වසරේ සමස්ත මූල්‍ය කාර්යසාධනය

ව්‍යාපෘතිය / වැඩසටහන	**ප්‍රතිපාදන (රු.මි.) 2024.12.31 දිනට**	**වියදම (රු.මි.) 2024.12.31 දිනට (අතැති බිල්පත් සමඟ)**	**මූල්‍ය ප්‍රගතිය (%)**
ඉන්දියානු නිවාස 4,000 වැඩසටහන	**225**	**203.06**	**90.25**
ඉන්දියානු නිවාස 10,000 වැඩසටහන	**3900**	**562.09**	**14.41**
සුහුරු පන්ති කාමර ව්‍යාපෘතිය	**310**	**0**	**0**
වතු නිවාස වැඩසටහන	**500**	**427.06**	**85.41**
යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන්	**100**	**54.86**	**54.86**
යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන් රු. බිලියන 2	**2022.60**	**258.51**	**12.78**
එකතුව	**7057.6**	**1505.58**	**21.33**

පරිච්ඡේදය-03 වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය

3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

12-13 පිටු අංක බලන්න

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

14 පිටු අංකය බලන්න

3.3මුදල් ප්‍රවාහ ප්‍රකාශය

15-16 පිටු අංක බලන්න

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්

17 පිටු අංකය බලන්න

3.5 ආදයම් එකතු කිරීමේ කාර්ය සාධනය

රු ,000

වගුව 3-1. ආදයම් එකතු කිරීමේ කාර්ය සාධනය

ආදයම් කේතය	අදායම් කේතයේ විස්තර	ආදයම් ඇස්තමේන්තුව		එකතු කරන ලද අදායම	
		මුල් ඇස්තමීන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය (රු.)	අවසාන අදායම් ඇස්තමේන්තුවේ % ලෙස
ආදයම් එකතු කිරීමේ ආයතනයක් නොවේ					

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

රු ,000

වගුව 3-2. වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය		
පුනරාවර්තන	517,000.00	519,960.00	485,072.00	93.29%
ප්‍රාග්ධන	5,052,000.00	5,052,000.00	1,102,064	21.81%

3.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

රු ,000

වගුව 0-3. මු.රෙ. 208 ප්‍රකාරව ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදන වල % ලෙස
			මුල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය		
	ජනාධිපති කාර්යාලය	2024 යටතේ වතුකරයේ ජීවත්වන පවුල් සඳහා ඉඩම් අයිතිය ලබාදීමේ අරමුණ වෙනුවෙන් ජනාධිපති ලේකම් කාර්යාලයට වෙන්කරන ලද මුදලින් කොටසක් වතුකරයේ යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති සඳහා යෙදවීම	2,022,610.00	-	75,472.00 මෙහිදී අප අමාත්‍යාංශය මඟින් සිදුකළ වියදම පමණක් දක්වා ඇති අතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලවලට ලබාදුන් ප්‍රතිපාදන වියදම් කළ තොරතුරු අප අමාත්‍යාංශය වෙත නොලැබෙන බැවින් එම තොරතුරු මෙහි ඇතුළත් කරනොමැත.	0.04%

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය

රු ,000

*වගුව **3-4.** මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය*

වත්කම් කේතය	කේත විස්තරය	**31.12.2024** දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	**31.12.2024** දිනට මුල්ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය% ලෙස වාර්තා කිරීම.
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්	-	-	-	-
9152	යන්ත්‍රෝපකරණ	-	248,859,499.00	-	-
9153	ඉඩම්	-	249,713,586.00	-	-
9154	අස්පෘශ්‍ය වත්කම්	-	-	-	-
9155	ජීව විද්‍යාත්මක වත්කම්	-	-	-	-
9160	කෙරීගෙන යන වැඩ	-	-	-	-
9180	බදු දෙන ලද වත්කම්	-	-	-	-

3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව

ඇමුණුම **01**

පරිච්ඡේදය-04 කාර්යසාධන දර්ශක

4.1 ආයතනයේ කාර්යසාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

වගුව 4- 1.ආයතනයේ කාර්යසාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

විශේෂිත දර්ශක		අපේක්ෂිත ඉලක්කය 202 4 වර්ෂය	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙසතත්‍ය නිමවුම			
			100%-90%	75%-89%	50% - 74%	
01) නිම කරන ලද නව නිවාස සංඛ්‍යාව	වතු නිවාස වැඩසටහන (ඉදිකළ)	නිවාස 377ක	100%			
	ඉන්දියානු ආධාර යටතේ ඉදිකරන ලද නිවාස (4000)	නිවාස ඒකක 138ක් සම්පූර්ණ කිරීම(ව්‍යාපෘති 4)	-	78%	-	-
	ඉන්දියානු ආධාර යටතේ ඉදිකරන ලද නිවාස (4000)	නිවාස ඒකක 150ක් සඳහා යටිතල පහසුකම් ලබාදීම (ව්‍යාපෘති 3)				40%
	ඉන්දියානු ආධාර යටතේ ඉදිකරන ලද නිවාස (10000)	නිවාස ඒකක 200 ක් සම්පූර්ණ කිරීම				10%*
	ඉන්දියානු ආධාර යටතේ ඉදිකරන ලද නිවාස සඳහා යටිතල පහසුකම් ලබාදීම. (10000)	නිවාස ඒකක 200 ක් සම්පූර්ණ කිරීම				
02)නුවරඑළිය, බදුල්ල සහ මහනුවර වතු පාසල් 60ක සුහුරු පන්ති කාමර ස්ථාපිත කිරීම						
2.1) මිලදී ගත් උපකරණ කට්ටල සංඛ්‍යාව		60				5%
2.2) අලුත්වැඩියා කළ සුහුරු පන්ති කාමර සංඛ්‍යාව		60				
03) යටිතල පහසුකම් සංවර්ධනය (රු 100 මිලියන)						
3.1) විරැකියාවෙන් මිදීම සඳහා වෘත්තීය පුහුණුව ලබාදුන් වතු තරුණ තරුණියන් සංඛ්‍යාව		ප්‍රතිලාභීන් 350			59%	
3.2) සිදුකළ පානීය ජල පහසුකම් ව්‍යාපෘති සංඛ්‍යාව		10				10%
3.3) සංවර්ධනය කළ ආගමික හා සංස්කෘතික මධ්‍යස්ථාන සංඛ්‍යාව		97	92%			
3.4) සිදු කළ විශේෂ අවශ්‍යතා ව්‍යාපෘති ගණන		10				40%
3.5) ප්‍රජා සවිබල ගැන්වීම සහ ජීවනෝපාය සංවර්ධනය යටතේ රැකියා විරහිත ස්වයං රැකියා සඳහා පහසුකම් සලසන ලද පවුල් සංඛ්‍යාව (එළුවන් බෙදා දීමේ ව්‍යාපෘතිය පමණක්)		පවුල් 25	90%			
3.6) දත්ත සමීක්ෂණය සඳහා තොරතුරු ලබාගත් වතු පවුල් සංඛ්‍යාව		993,021 (මූලාශ්‍රය:- වැවිලි මානව සංවර්ධන භාරය, 2024)				0%
04) රු බිලියන 2 වැඩසටහන (වැවිලි අංශයේ යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති)						
4.1) ආගමික සහ සංස්කෘතික පහසුකම් ලබා දුන් ආගමික ස්ථාන සංඛ්‍යාව		595				19%
4.2) පිරිසිදු පානීය ජලය සහ සනීපාරක්ෂණ පහසුකම් ව්‍යාපෘති සංඛ්‍යාව		ජල සැපයුම් ව්‍යාපෘති සංඛ්‍යාව 15 සනීපාරක්ෂණ පහසුකම් ව්‍යාපෘති සංඛ්‍යාව 2				15%
4.3) වතුකරයේ ආපදාවට ලක්වූ ජනතාව සඳහා සැපයූ සෙවිලි තහඩු සංඛ්‍යාව		සෙවිලි තහඩු 8500 ලයින් කාමර3ක්				10%

	සඳහා සෙවිළි තහඩු				
4.4)සංවර්ධනය කළ පාසල් සංඛ්‍යාව					
4.4.1) පන්ති කාමර පහසුකම් සැපයූ පාසල් සංඛ්‍යාව	පාසල් 24				0%
4.4.2) STEM ගුරු පුහුණුව ලබාදුන් ප්‍රතිලාභීන් සංඛ්‍යාව	ප්‍රතිලාභීන්-2400	100%			
4.4.3) තාක්ෂණික ඉගැන්වීම් උපකරණ ලබාදුන් පාසල් සංඛ්‍යාව	412				0%
4.4.4) පාසල් සංවර්ධන ව්‍යාපෘති සිදුකළ පාසල් සංඛ්‍යාව	පාසල් 24				33%
4.5)ක්‍රීඩා සංවර්ධනය					
4.5.1) සංවර්ධනය කළ ක්‍රීඩා පිටි ව්‍යාපෘති සංඛ්‍යාව	ව්‍යාපෘති 73				4%
4.5.2) ක්‍රීඩා උපකරණ ලබාදුන් ක්‍රීඩා සමාජ සංඛ්‍යාව	ක්‍රීඩා සමාජ 1351				0%
4.6) සංවර්ධනය කළ මාර්ග හා පාලම් ව්‍යාපෘති සංඛ්‍යාව	ව්‍යාපෘති 396				19%
4.7)පොදු පහසුකම් ව්‍යාපෘති සංඛ්‍යාව	ව්‍යාපෘති 73				11%
4.8) වතුකරයේ ජනතාවගේ සෞඛ්‍ය තත්ත්වය ඉහළ නැංවීම සඳහා සිදු කළ සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන් සංඛ්‍යාව					
4.8.1) සනීපාරක්ෂක කට්ටල සංඛ්‍යාව	2000				0%
4.8.2) මාතෘ කට්ටල සංඛ්‍යාව	1000				
4.9) ප්‍රජා සවිබල ගැන්වීම සහ ජීවනෝපාය සංවර්ධනය					
4.9.1) සිදු කළ තරුණ සමූළු සංඛ්‍යාව	1	100%			
4.9.2) ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘති සංඛ්‍යාව	4				0%
4.10) හිමිකම් ඔප්පු ප්‍රදානය කළ සංඛ්‍යාව	2000				36%

10%*

අත්තිවාරම් මට්ටමට සම්පූර්ණ කළ නිවාස- ඒකක 406, බිත්ති මට්ටමට සම්පූර්ණ කළ නිවාස- ඒකක 35, වහළ මට්ටමට සම්පූර්ණ කළ නිවාස- ඒකක 18 සහ ඉදිකිරීම් අවසන් කළ නිවාස- ඒකක 5

පරිච්ඡේදය-05 තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය

5.1හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු

වගුව 5- 1.හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු

ඉලක්කය / අරමුණ	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක		මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
				0%-49%	50%-74%	75% - 100%
තිරසර සංවර්ධන ඉලක්කය 11 **2030 වනවිට සියළු දෙනාටම ප්‍රමාණවත්, ආරක්ෂිත නිවාස ලැබීම හා වාසස්ථාන වැඩිදියුණු කිරීම තහවුරු කිරීම**	ලයින් කාමරවල වෙසෙන පවුල් 4,500 ක් සඳහා නව නිවාස හා ඉඩම් හිමිකම ලබාදීම	1.	ඉදි කරන ලද නව නිවාස සංඛ්‍යාව හා ලබාදුන් ඉඩම් හිමිකම් ඔප්පු ප්‍රමාණය	**18%**		
	අබලන් වූ ලයින් කාමර 1000 ක වහල නැවත සෙවිළි කිරීම	2	සෙවිළි කරන ලද ලයින් කාමර සංඛ්‍යාව	**3.4%**		
තිරසර සංවර්ධන ඉලක්ක 6 **වසර 2030 වනවිට සියළු දෙනාටම ප්‍රශස්ත මට්ටම් යටතේ පානීය ජලය ලබාගැනීමට සමාන අවස්ථා තහවුරු කිරීම. වසර 2030 වනවිට ප්‍රමාණවත් සනීපාරක්ෂාවක් හා ස්වස්ථතාවක් ලැබීමේ අවස්ථා සියළු දෙනාටම අත්පත්කර ගැනීම**	පානීය ජල පහසුකම් නොමැති පවුල් 4000 ක් සඳහා ජල පහසුකම් සම්පාදනය	1	පානීය ජල පහසුකම් ලැබූ පවුල් සංඛ්‍යාව		**53.6%**	
	ප්‍රමාණවත් සනීපාරක්ෂක පහසුකම් නොමැති පවුල් 3500 ක් සඳහා සනීපාරක්ෂක පහසුකම් ලබා දීම	1	සනීපාරක්ෂක පහසුකම් ලැබූ පවුල් සංඛ්‍යාව /		**41.5%**	

5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

ශ්‍රී ලංකාවේ වාසය කරන මිලියන එකක් පමණ වන වැවිලි ප්‍රජාවගේ ජීවන තත්ත්වය ඉහල නැංවීම මෙම වතු නිවාස අංශයේ ප්‍රමුඛ කාර්යභාරයකි.

වැවිලි ප්‍රජාව යනු, ශ්‍රී ලංකාවේ අනෙකුත් ජන කොටස් හා සැසඳීමේදී, වඩාත් පහළ ජීවන තත්ත්වයකට උරුමකම් කියනු ලබන ජන කොට්ඨාසයක් වන අතර ජන සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තු දත්ත වලට අනුව ලංකාවේ අනෙකුත් ජන කොටස් හා සැසඳීමේදී ඔවුන් උපයන මාසික ආදායම පහල මට්ටමක පවතින අතර ප්‍රජාවගේ විශේෂයෙන් වයස අවුරුදු 05 ට අඩු දරුවන්ගේ මන්ද පෝෂණ තත්ත්වය ඉතා ඉහළ මට්ටමක පවතී. ජනගහණයෙන් වැඩි ප්‍රතිශතයක් සඳහා ආරක්ෂිත පානීය ජල සම්පාදනය ගැටළුවක් වී ඇත. ඉතා අවම පහසුකම් සහිත වර්ග අඩි 200 ට පමණ සීමාවූ ටකරන් සෙවිලිකල ලැයින් කාමර සිය වාසස්ථාන කොට ජීවත් වේ. තිරසර ලෙස සංවර්ධිත වූ ශ්‍රී ලංකාවක් සඳහා වන තිරසර සංවර්ධන අරමුණු අතරට ගැනෙන දිළිඳුකම අවම කිරීම තහවුරු කිරීම ළමා මන්ද පෝෂණ තත්ත්ව දර්ශක වලට ලහාවීම සහ ආරක්ෂිත හා වැඩිදියුණු කල වාසස්ථාන හිමිකර දීම, සැමට ප්‍රශස්ථ මට්ටමේ පානීය ජලය ලබා ගැනීමේ අවස්ථා හිමිකර දීම යන ඉලක්ක සාක්ෂාත් කිරීම සඳහා ක්‍රියාකිරීමේදී, එම පහසුකම් අවම මට්ටමේ පවතින වැවිලි ප්‍රජාව කෙරෙහි වඩාත් අවධානය යොමු කිරීම අත්‍යාවශ්‍ය කරුණක්ව තිබේ.

ඒ අනුව වැවිලි ප්‍රජාව සඳහා සිය ආරක්ෂිත වාසස්ථාන හිමිකර ගැනීමේ අයිතිය තහවුරු කිරීම උදෙසා ඔවුන් වෙත සින්නක්කර අයිතිය හිමිවූ පර්චස් 7 ක භූමි භාගයක් හා පානීය ජල පහසුකම් සමඟ වැඩි දියුණු කරන ලද සනීපාරක්ෂක පහසුකම් වලින් යුක්ත තනි නිවහන් ලබා දීමට හැකි වීම මෙම අංශය ලැබූ විශේෂ ජයග්‍රහණයක් ලෙස සැළකිය හැකිය.

එසේ නමුත්, විවිධ පාරිසරික හේතු හා තාක්ෂණික හේතූන් මත අපේක්ෂිත ඉලක්ක සපුරාගැනීම අභියෝගයක් වී ඇත.

නිවාස ව්‍යාපෘතිය සඳහා අපේක්ෂිත ඉලක්ක අත්පත් කර ගැනීම සඳහා ප්‍රමාණවත් පරිදි ප්‍රතිපාදන නොමැති වීමත්, නිවාස ඉදිකිරීම සඳහා සුදුසු ඉඩකඩම් සපයා ගැනීම අසීරු වීමත්, ඉඩම් අත්පත් කර ගැනීම සඳහා දීර්ඝ කාලයක් ගතවීමත්, විශේෂයෙන් නිවාස ඉදි කිරීම් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබන ක්‍රමවේදයේ පවතින දුර්වලතාත් හේතුවෙන් අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීම අභියෝගයක් වී ඇත.

වැවිලි ප්‍රජාවගෙන් හරි අඩකට පමණ ආරක්ෂිත පානීය ජල පහසුකම් නොමැති වීමත්, ශ්‍රී ලංකාව විසින් තිරසර සංවර්ධන ඉලක්ක අත්පත් කර ගැනීමේ කාර්යභාරයේදී වැවිලි ප්‍රජාවගේ පානීය ජල අවශ්‍යතා සම්පූර්ණ නොකොට එම ඉලක්ක වෙත ලඟාවීම අභියෝගයක්ව ඇති අවස්ථාවක, වැවිලි ප්‍රජාව ඉලක්ක කොට ජල සම්පාදන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට ප්‍රමාණවත් අවධානයක් යොමු නොවීම හා ඒ සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන වෙන් නොවීමත් විශේෂයෙන්ම ආරක්ෂිත පානීය ජලය සපයා ගැනීම සඳහා සුදුසු ජල මූලාශ්‍ර නොමැති වීමත්, පවතින ජල මූලාශ්‍ර පාදක කර ගනිමින් ජල ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා විශාල මුදලක් වැයවීමත් ජල ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රමාණවත් පරිදි ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කිරීමට අදාළ පාර්ශවයන් කටයුතු නොකිරීමත් හේතුවන් අපේක්ෂිත ඉලක්ක සුපරා ගැනීම ගැටළුක් වී ඇත.

වැවිලි ප්‍රදේශ බොහොමයක් කඳුකරයට සීමාවී ඇති අතර එහි භූමි විෂමතාව සැලකිල්ලට ගැනීමේදී ඉදිකිරීම් ව්‍යාපෘති සිදු කිරීමට අධික පිරිවැයක් දැරීමට සිදුවීමත්, එම ප්‍රදේශ බොහොමයක් අධි ආරක්ෂිත සංවේදී කලාප වශයෙන් හඳුන්වා දීමත් හේතුවෙන් ඉදිකිරීම් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය අනුමැතීන් කල් ගත වීමත් එසේ නොමැති අත්‍යවශ්‍ය ස්ථාන සඳහා නව ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම පාරිසරික හේතු නිසා අනුමත නොකිරීමද ගැටළුවක් වී ඇත.

පරිච්ඡේදය-06 මානව සම්පත් පැතිකඩ

6.1සේවක සංඛ්‍යා කළමනාකරණය (2024.12.31 දිනට)

වගුව 6- 1. සේවක සංඛ්‍යා කළමනාකරණය (2024.12.31 දිනට)

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු/ අතිරික්ත
ජ්‍යෙෂ්ඨ	21	14	ඇබෑර්තු - 06*
තෘතියික	04	01	ඇබෑර්තු - 03
ද්විතියික	293	276**	ඇබෑර්තු - 17
ප්‍රාථමික	23	22	ඇබෑර්තු - 01
	341	313	27

සටහන :

*** නියෝජ්‍ය අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන) ටී.ඩී. බංගමුව මහත්මිය වැවිලි කලාපය සඳහා වූ නව ගම්මාන සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් තනතුරේ ද්විතීයන පදනම මත තාවකාලිකව 2024.12.02 දින සිට 2026.12.01 දින දක්වා වර්ෂ 02ක කාලයක් සඳහා පූර්ණකාලීනව මුදාහැර ඇත. එබැවින්, නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුර පුරප්පාඩු වශයෙන් සලකා නොමැත. ඒ අනුව, ජ්‍යෙෂ්ඨ මට්ටමේ ඇබෑර්තු සංඛ්‍යාව 06 ක් වේ.**

**** පවතින ද්විතියික සේවක සංඛ්‍යාව 276 තුළ ස්ථිර නිලධාරීන් 274 ක් සහ කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන ඇති තාක්ෂණ නිලධාරීන් දෙදෙනෙකු ද (02) ඇතුළත් වේ.**

6.2ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයට බලපා ඇති ආකාර

ඉහත වගුවේ සඳහන් පරිදි පුරප්පාඩු 27 ක් පැවතුණ ද, සේවයේ නිරත නිලධාරීන් විසින් තම රාජකාරිවලට අමතරව පුරප්පාඩු තනතුරුවල රාජකාරි ද ආවරණය කරමින් කැපවීමෙන් හා සඵලදායී ලෙස රාජකාරිවල නිරත වෙමින් මෙම අංශයේ කාර්යයන් කාර්යක්ෂමව පවත්වාගෙන යාම සඳහා මනා සේවයක් ලබා දී ඇත.

6.3 මානව සම්පත් සංවර්ධනය

අංක 01/2023 අයවැය චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව සේවා ව්‍යවස්ථා , බඳවාගැනීම් පටිපාටි හ චක්‍රලේඛ විධිවිධාන පරිදි නිලධාරීන් අනිවාර්යයෙන්ම සහභාගී විය යුතු පුහුණු අවස්ථා පමණක් ලබාදිය යුතු බැවින්, අනෙකුත් පාඨමාලා තාවකාලිකව සම්පාදනය කිරීමට නොහැකි වී ඇත. ඒ අනුව මානව සම්පත් සංවර්ධනය උදෙසා පහත සඳහන් පරිදි ක්‍රියාකර ඇත.

වගුව 6- 2. 2024 වර්ෂය තුළ පවත්වන ලද සම්මන්ත්‍රණ, වැඩමුළු හා රැස්වීම් පිළිබඳ තොරතුරු

අනු අංකය	වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාලසීමාව	සමස්ත ආයෝජනය		වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය)	නිමැවුම/ ලබාගත් දැනුම
				දේශීය	විදේශීය		
1	රාජ්‍ය කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි පාඨමාලාව, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය	02	අවු. 02	රු. 208,000/- (පාඨමාලාවේ අවසන් වාරික ගෙවීම)	-	දේශීය	-සේවා ව්‍යවස්ථාව මගින් පාලනය වන පරිදි, නිලධාරීන්ගේ උසස් වීම් සඳහා සුදුසු කාර්යසාධනයක් මෙම පාඨමාලා හැදෑරීම මගින් ලබාගෙන ඇත.
2	සිවිල් විශ්‍රාම වැටුප් ගණන් බැලීම් හා ගෙවීම්	03 (විශ්‍රාම වැටුප් සකස් කිරීමේ නිලධාරීන්)	දින 02	රු. 39,000/-	-	දේශීය	-සිවිල් විශ්‍රාම වැටුපකට හිමිකම සඳහා සපුරාලිය යුතු කොන්දේසි පිළිබඳ අවබෝධය. -විධිමත් පරිදි සේවය අවසන් කළ නිලධාරීන් විශ්‍රාම ගැන්වීමේ හේතු පිළිබඳ අවබෝධය. -විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ විශ්‍රාමිකයන්ට ලබා දීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රියා පටිපාටිය පිළිබඳ අවබෝධය.
3	ගබඩා කළමනාකරණය සහ ප්‍රසම්පාදන ක්‍රියාවලිය	01 (ගබඩා විෂයභාර නිලධාරියා)	දින 02	රු. 13,000/-	-	දේශීය	-ගබඩාකරණයේ දී සහ ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී අනුගමනය කළ යුතු විධිමත් ක්‍රියාමාර්ග පිළිබඳ අවබෝධය.
4	රජයේ වැටුප් ගෙවීම් ක්‍රියාවලිය	02 (ගිණුම් අංශයේ වැටුප් සකස් කිරීමේ නිලධාරීන්)	දින 03	රු. 36,000/-	-	දේශීය	-Cigas මෙහෙයුම් පද්ධතිය මගින් රජයේ නිලධාරීන් වෙත වැටුප් ගෙවීම් ක්‍රියාවලිය පිළිබඳ න්‍යායාත්මක දැනුම සහ ප්‍රායෝගික පුහුණුව.

5	ගිණුම් කටයුතු ප්‍රවර්ධනය	02 (ගිණුම් අංශයේ නිලධාරින්)	දින 01	රු. 14,000/-	-	දේශීය	-රජයේ කාර්යාලයක පතවන්වා ගතයුතු පොත්පත් හා ලේඛන පිළිබඳ අවබෝධය -ගෙවීම් කාර්ය පරිපාටිය පිළිබඳ දැනුම -මුදල් පොත නඩත්තු කිරීම පිළිබඳ දැනුම -ඇස්තමේන්තු සකස් කිරීම පිළිබඳ දැනුම -බැංකු සැසඳුම් පිළියෙළ කිරීම හා විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම පිළිබඳ අවබෝධය.
6	විද්‍යාත්මක, පිරිමැසුම්දායක සහ ආරක්ෂිත රිය පැදවීම	03 (රියදුරන්)	දින 01	රු. 18,000/-	-	දේශීය	-රිය පැදවීමේදී අනුගමනය කළ යුතු විද්‍යාත්මක කරුණු හා පිරිමැසුම්දායක ලෙස රිය පැදවීම කෙරෙහි අවධානය. -මාර්ග නීති, සංඥා සහ රියදුරන්ගේ වගකීම් මෙන්ම ආචාර ධර්ම පිළිබඳව අවබෝධය.
7	ආකල්ප සංවර්ධනය, ධනාත්මක චින්තනය හා ආතති කළමනාකරණය (දැනුවත් කිරීමේ වැඩමුළුවක්)	සියලුම මාණ්ඩලික නිලධාරින් හා අනෙකුත් කාර්ය මණ්ඩලය	දින 02	රු. 69,405/-	-	දේශීය	-මෙම අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩලයේ ආකල්ප වර්ධනය කර ඵලදායී හා කාර්යක්ෂම සේවයක් ලබා ගැනීම අරමුණු කොට ගෙන මෙම පුහුණු වැඩසටහන පවත්වන ලදී.

ගෙවීම් රහිත පාඨමාලා

අංක 18/2020 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධිවිධාන පරිදි, තවදුරටත් පැය 150 සිංහල භාෂා පාඨමාලා සම්පූර්ණ කළ යුතු නිලධාරින් 07 දෙනෙකු සහ පැය 150 දෙමළ භාෂා පාඨමාලා සම්පූර්ණ කළ යුතු නිලධාරින් 02 දෙනෙකු හඳුනාගෙන එම සියලුම නිලධාරින් රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන භාෂා පාඨමාලා (මාර්ගගත) සඳහා යොමු කර ඇත

පරිච්ඡේදය-07 අනුකූලතා වාර්තාව

වගුව 7. 1. අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	-		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	-		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	-		
1.6	වෙනත්	-		
2	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙලකර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත්	අනුකූල වේ		

	කිරීම			
2.6	වෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA – N20) යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
03	**මූල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරාදී තිබීම	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම	අනුකූල වේ		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ		
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD)	අනුකූල වේ		

	නියමිත දිනට ඉදිරිපත් කිරීම			
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල නොවේ	ඇතැම් විගණන විමසුම් සඳහා පිළිතුරු ලබාගැනීමේදී මතුවන ප්‍රයෝගික ගැටළු හේතුවෙන් පිළිතුරු ලබාදීම ප්‍රමාද විය.	
6	අභ්‍යන්තර විගණනය			
6.1	මු.රෙ. 134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ.		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම	අනුකූල නොවේ	යොමුකරන ලද විමසුම් 15න් 03ක් සඳහා පිළිතුරු ඉදිරිපත් කිරීම ප්‍රමාද වී ඇත. කඩිනමින් අදාල පිළිතුරු ඉදිරිපත් කරන ලෙස උපදෙස් ලබාදෙන ලදී.	
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
7	විගණන හා කළමනාකරණ කමිටු			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	අනුකූල නොවේ	2024 වර්ෂය සඳහා විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 03ක් පවත්වා ඇත. 2024.12.09 දින සිට ප්‍රධාන අභ්‍යන්තර	

			විගණකවරයා ස්ථානමාරු වී ගොස් ඇති බැවින් අවසාන කාර්තුව සඳහා මේ දක්වා පැවැත්වීමට නොහැකි විය. කඩිනමින් අදාල රැස්වීම් පවත්වනු ලැබේ.	
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තාකර තිබීම	අනුකූල වේ		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ	*අමාත්‍යාංශයට අදාලව 2023 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව යොමු කර ඇත. නමුත් සෞම්‍යාමූර්ති තොණ්ඩමාන් අණුස්මරණ පදනමට අදාල ආයතන වල භාණ්ඩ සමීක්ෂණ වාර්තාව යොමුකර නොමැත.	
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම	අනුකූල නොවේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම	අනුකූල වේ		
9	වාහන කළමනාකරණය			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික	අනුකූල වේ		

	සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම			
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම	අනුකූල නොවේ	ගර්හිත වාහනනොමැත	
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103,104,109, හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල වේ		
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම.	අනුකූල වේ		
10	බැංකු ගිණුම් කළමනාකරණය			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	එවැනි ගිණුම් නොතිබිණි		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල නොවේ	එවැනි ඇතැම් ශේෂ හඳුනාගැනීමේදී මතුවන ගැටළු හේතුවෙන් මාසයක කාලයක් තුළ නිරවුල් කිරීමට නොහැකි වී ඇත.	
11	ප්‍රතිපාදන උපයෝජනය			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ		
11.2	මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එලඹීම	අනුකූල වේ		

12	රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්			
12.1	සීමාවන්ට වලට අනුකූල වීම.	අනුකූල වේ		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අනුකූල වේ		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල නොවේ	සේවය අත ඇර ගිය නිලධාරීන්ගේ හිඟ හිටි ණයශේෂ පැවතීම.	එවැනි අවස්ථාවලදී ප්‍රයෝජනයට ගැනීම සඳහා අවශ්‍ය සියලු පෞද්ගලික තොරතුරු ඔවුන්ගේ පෞද්ගලික ලිපි ගොනු වලට ඇතුළත් කිරීම.
13	පොදු තැන්පත් ගිණුම			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම.	අනුකූල වේ		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
14	අග්‍රිම ගිණුම			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ		
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ		
15	ආදායම් ගිණුම			
15.1	අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	අනුකූල වේ		
15.2	රැස් කර තිබූ ආදයම්, තැන්පතු ගිණුමට බැර	අනුකූල වේ		

	නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම			
15.3	මු.රෙ 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල වේ		
16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම	අනුකූල වේ		
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ		
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
18	පූරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම			
18.1	අංක 05/2018 හා 05/2018(I) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අනුකූල නොවේ		2024 වර්ෂයේදී අමාත්‍යාංශයේ විෂය නාමය කිහිප අවස්ථාවකදී වෙනස් වී ඇත. වර්තමානයේදී අංක 2412/08 හා 2024.11.25
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පූරවැසි/සේවාලාභී	අනුකූල නොවේ		

	ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම			දිනැති අතිවිශේෂ ගැසට් නිවේදනය අනුව වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශයේ ප්‍රජා යටිතල පහසුකම් විෂය පථයට අදාල දැක්ම හා මෙහෙවර අනුව පුරවැසි ප්‍රඥප්තිය සකස් කරමින් පවතී.
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල වේ		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල වේ		
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල වේ		
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම	අනුකූල වේ		
20	**විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මඟින්	අනුකූල වේ		

	පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම			

29557

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

ජලසම්පාදන අමාත්‍යාංශය
12 JUN 2025
ලැබුණු දිනය

මගේ අංකය
எனது இல.
My No. ඩබ්ඒඑස්/ඩී/එම්යූඩීඕඑව්(ඩබ්එස්එස්)/එෆ්ජී/2024

ඔබේ අංකය
உமது இல.
Your No.

දිනය
திகதி
Date 2025 මැයි 30 දින

CFO II

ලේකම්

නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යාංශය

03 JUN 2025

ජල සම්පාදන හා වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශයේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

යටෝක්ත වාර්තාව මේ සමඟ ඉදිරිපත් කරමි.

MINISTRY OF URBAN DEVELOPMENT & HOUSING
Accounts Branch
04 JUN 2025
02

එම්.ඒ.එස්.පුෂ්පරාණි
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට.

පිටපත: අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව

F12 (CB)
Keep a copy and
Sent original
CFO Counter
8 4/6/25

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. } ඩබ්ඒඑස්/ඩී/එම්යූඩීසීඑව(ඩබ්එස්එස්)/ එෆ්ජේ/2024

ඔබේ අංකය உமது இல. Your No. }

දිනය திகதி Date } 2025 මැයි 30 දින

ලේකම්
නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යාංශය

ශීර්ෂය 166 - ජල සම්පාදන හා වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශයේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 166 - ජල සම්පාදන හා වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශයේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ජල සම්පාදන හා වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යථා කාලයේදී ඉදිරිපත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ජල සම්පාදන හා වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශයේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් 1 හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 **තත්ත්වාගණනය කල මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම**

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව ජල සම්පාදන හා වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශයේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව ජල සම්පාදන හා වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශයේ, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව ජල සම්පාදන හා වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට

හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

- ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

  - ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

  - අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

.6.1 මූල්‍ය නොවන වත්කම්

(අ) 2022 දෙසැම්බර් 31 දිනට සිදුකරන ලද භාණ්ඩ සමීක්ෂණයේදී හඳුනාගත් පරිදි වටිනාකම රු.1,341,918 ක් වූ භාණ්ඩ ඒකක 155 ක් හා 2023 දෙසැම්බර් 31 දිනට සිදුකරන ලද භාණ්ඩ සමීක්ෂණයේදි හඳුනාගත් වටිනාකම රු.275,975 ක් වූ භාණ්ඩ ඒකක 119 ක් පිළිවෙලින් 2023 මාර්තු 15 හා 2024 මැයි 15 දිනයන්හිදී වෙන්දේසිකර හා අපහරණය කර තිබුණද එම වත්කම්වල පිරිවැය ස්ථාවර වත්කම්වලින් ඉවත්කර නොතිබූ බැවින් 2024 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කර තිබූ මූල්‍ය ප්‍රකාශනවල ස්ථාවර වත්කම් වටිනාකම රු.1,617,893 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) අමාත්‍යාංශය යටතේ ලියාපදිංචි නොවූ නමුත් ස්ථාවර වත්කම් ලෙස දක්වා තිබූ එකතුව රු.10,200,000 ක් වූ මෝටර් වාහන 03 ක් 2023 මාර්තු 09 දින නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය වෙත ලබා දී තිබුණද, එම වත්කම්වල පිරිවැය ස්ථාවර වත්කම්වලින් ඉවත්කර නොතිබුණි.

(ඇ) වෙනත් රජයේ ආයතනයන් නමින් ලියාපදිංචි කර තිබූ වටිනාකම රු.46,030,000 ක් වූ වාහන 13 ක අයිතිය අමාත්‍යාංශයට පවරාගැනීමකින් තොරව අමාත්‍යාංශයේ වත්කම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබීමෙන් මූල්‍ය නොවන වත්කම් ශේෂය රු.46,030,000 කින් වැඩියෙන් සටහන් වී තිබුණි.

(ඈ) හිටපු රාජ්‍ය අමාත්‍යවරයාට රාජකාරී කටයුතු වෙනුවෙන් ලබා දී තිබූ රු.1,393,042 ක් වටිනා කැමරා උපකරණ, මුද්‍රණ යන්ත්‍රය හා ලැප්ටොප් පරිගණකය 2022 මැයි 09 දින රටේ පැවති අර්බුදකාරී තත්ත්වය මත විනාශ වී තිබූ බව ආරවිවිකටටුව පොලිස් ස්ථානාධිපති

(වැ.බ), අමාත්‍යාංශය වෙත දන්වා තිබුණි. ඒ අනුව එම වත්කම් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104(1)(අ), 105 හා 109 ප්‍රකාරව කටයුතු කර නොතිබුණු අතර මූල්‍ය ප්‍රකාශනවල, ACA-6 ආකෘතියෙහි මූල්‍ය නොවන වත්කම් ලෙස එහි පිරිවැය සටහන් කර තිබුණි. ඒ අනුව වත්කම් වටිනාකම එම ප්‍රමාණයෙන් වැඩියෙන් සටහන් වී තිබුණි.

1.6.2 අග්‍රිම ශේෂය

මූල්‍ය ප්‍රකාශනවල ACA-3 ආකෘතියේ සඳහන් පරිදි වෙනත් මූලාශ්‍රවලින් ලැබීම් රු.361,635,417 ක් වුවද මාසික ගිණුම් සාරාංශ අනුව එහි වටිනාකම රු.256,924,792 ක් වී තිබුණි. ඒ අනුව රු.104,710,625 ක වෙනසක් නිරීක්ෂණය විය.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

ඉකුත් වර්ෂයට අදාළ වාර්තාවේ ඡේද යොමුව	ක්‍රියාත්මක කර නොතිබුණු නිර්දේශය	මෙම වාර්තාවේ ඡේදවලට යොමුව
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව 2023 වර්ෂයේ විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාවේ 1.6.2(අ) ඡේදය	2022 දෙසැම්බර් 31 දිනට සිදුකරන ලද භාණ්ඩ සමීක්ෂණයේදී හඳුනාගත් පරිදි වටිනාකම රු.1,341,918 ක් වූ භාණ්ඩ ඒකක 155 ක් 2023 මාර්තු 15 දින අපහරණය හා වෙන්දේසි කර තිබුණද එම වත්කම්වල පිරිවැය ස්ථාවර වත්කම්වලින් ඉවත්කර නිවැරදි වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කල යුතු වීම.	1.6.1(අ)
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව	අමාත්‍යාංශය යටතේ ලියාපදිංචි නොවූ 2023 මාර්තු 09 දින නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය වෙත ලබාදී ඇති ස්ථාවර වත්කම්	1.6.1(ආ) සහ (ඇ)

2023 වර්ෂයේ විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාවේ 1.6.2(ආ) සහ (ඇ) ඡේද	ලෙස දක්වා තිබූ වටිනාකම රු.10,200,000 ක් වූ මෝටර් වාහන 03 ක් සහ වෙනත් ආයතන නමින් ලියාපදිංචි කර තිබූ වටිනාකම රු.46,030,000 ක් වූ වාහන 13 ක් ස්ථාවර වත්කම්වලින් ඉවත්කිරීමට කටයුතු කර නොතිබුණි.	
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව 2023 වර්ෂයේ විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාවේ 1.6.2(ඇ) ඡේදය	2022 මැයි 09 දින රටේ පැවති අර්බුදකාරී තත්ත්වය මත හිටපු රාජ්‍ය අමාත්‍යවරයාට රාජකාරී කටයුතු වෙනුවෙන් ලබා දී තිබූ රු.1,393,042 ක් වටිනා කැමරා උපකරණ, මුද්‍රණ යන්ත්‍රය හා ලැප්ටොප් පරිගණකය විනාශ වී තිබීම සහ එම උපකරණවල වටිනාකම පොත්වලින් ඉවත් කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග නොගැනීම නිසා මූල්‍ය ප්‍රකාශනවල, මූල්‍ය නොවන වත්කම්වල වටිනාකම වැඩියෙන් සටහන් වී තිබීම සහ ඊට අදාළව මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතු වීම.	1.6.1(ඇ)

3. මූල්‍ය සමාලෝචනය

3.1 වියදම් කළමනාකරණය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 50 ට අනුකූලව සකසුරුවම්කම සහ කාර්යක්ෂමතාව පිළිබඳ අවධානය යොමු නොකර ඇස්තමේන්තු සකස් කිරීම හේතුවෙන් වැය විෂයන් 30 ක සියයට 52 සිට 100 දක්වා පරාසයක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.

3.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නීති, රීති හා රෙගුලාසිවලට යොමුව	අනුකූල නොවීම
(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය	
103(1)(ආ), 104(3), 104(4)	එවකට ජල සම්පාදන විෂයභාර රාජ්‍ය අමාත්‍යවරයා වෙත අනුයුක්ත කර තිබූ අංක CAV-4557 දරන V8 වර්ගයේ ජීප් රථය 2023 දෙසැම්බර් 22 සහ 2023 දෙසැම්බර් 29 දිනවල රිය අනතුරුවලට ලක්වී අලාභහානි සිදුවී තිබුණි. 2023 දෙසැම්බර් 22 දින සිදුවූ අනතුර පිළිබඳව පොලීසියට වාර්තාකර නොතිබුණු අතර ඊට අදාළව වහාම ඉදිරිපත් කල යුතු ප්‍රාරම්භක වාර්තාව ඉදිරිපත් කිරීම පිළිවෙලින් දින 32 ක සහ දින 30 ක ප්‍රමාදයකින් පසුව සිදුකර තිබුණි. එසේම අනතුර සිදුවී තුන්මසක් ඇතුලත පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කල යුතු වුවත් 2023 දෙසැම්බර් මස 23 සිදුවූ අනතුර සම්බන්ධයෙන් පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කිරීම අනතුරු සිදු වී මාස 11 ක් ඉක්ම වූ පසුව සිදුකර තිබුණි.
(ආ) 2017 දෙසැම්බර් 21 දිනැති වත්කම් කළමණාකරණ චක්‍රලේඛ අංක 2/2017 හි 02 වගන්තිය	රජයට අයත් සෑම වාහනයක්ම එම ආයතනය නමින් ලියාපදිංචි කලයුතු අතර ජල තාක්ෂණය සඳහා චීන ශ්‍රී ලංකා ඒකාබද්ධ පර්යේෂණ සහ ආදර්ශන මධ්‍යස්ථානය වෙත ප්‍රදානයක් ලෙස ලැබී තිබූ රු.40,441,639 ක් වටිනා ජංගම ජල පරීක්ෂණ රථය ලියාපදිංචි කර තිබුණේ ජල සම්පාදන අමාත්‍යාංශයේ ලේකම්, පාලන හා මුදල් වශයෙනි.

(ඇ) 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020(i) හා 2024 මැයි 29 දිනැති අංක 02/2024 දරන රාජ්‍ය මුදල් වක්‍රලේඛ

(i)	01/2020(i)-2.5 ඡේදය 02/2024-04(i)ඡේදය 02 (ආ) ඡේදය	අංක CAV-4557 හා අංක KP-7684 දරන ජීප් රථවලට අනතුරු සිදු වී 2025 ජනවාරි 20 දින වන විට වසරකට වැඩි කාලයක් ගත වී තිබුණද මුදල් රෙගුලාසි ප්‍රකාරව අවශ්‍ය පරීක්ෂණ සිදු කර අමාත්‍යාංශ ලේකම්වරයා දැනුවත් කිරීම හා ගිණුම් පොත්වලින් කපාහැරීමට තීරණය කර තිබේ නම් ඒ සඳහා පොදු 283, 284 සහ 285 ආකෘති පත්‍ර මගින් මහා භාණ්ඩාගාරයට වාර්තා කර නොතිබුණි. එමෙන්ම අංක CAV-4557 දරන ජීප් රථයට සිදුවූ අනතුරින් රක්ෂණය විසින් ප්‍රතිපූර්ණය නොකරනලද වටිනාකම රු.1,817,070 ක්වූ අලාභය සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන්ගෙන් අධිභාරයක් ලෙස අයකර ගත යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.
(ii)	2.1 ඡේදය	CAS-9494 දරන V-8 වර්ගයේ ජීප් රථයට සිදුවූ රු.13,506,764 ක හානිය සම්බන්ධයෙන් සම්පූර්ණ විස්තර මහා භාණ්ඩාගාරයට යොමුකර භාණ්ඩාගාර ලේකම්වරයාගෙන් හෝ නියෝජ්‍ය ලේකම්වරයාගෙන් නියෝග ලබාගැනීමට 2025 ජනවාරි වන විටත් කටයුතු කර නොතිබුණි.

3 බැංකු ගිණුම් මෙහෙයවීම

මහ කොළඹ ජලය සහ අපජලය කළමනාකරණ වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියෙහි බැංකු ගිණුම් 02 කට අදාළව ශේෂයක් නොපවතින බව මූල්‍ය ප්‍රකාශනවල ඇමුණුම (viii) හි සඳහන්ව තිබුණද, අංක

88979006 දරන බැංකු ගිණුමේ මුදල් පොතට අනුව ශේෂය සහ බැංකු ප්‍රකාශනයට අනුව ශේෂය පිළිවෙලින් රු.140,262 ක් හා රු.49,140,262 ක් බවත් අංක 7040565 ගිණුමෙහි මුදල් පොතට අනුව ශේෂය සහ බැංකු ප්‍රකාශනයට අනුව ශේෂය පිළිවෙලින් රු.11,486,438 ක් හා රු.3,000 ක ශේෂයක් නිරීක්ෂණය විය. මෙම වෙනස්කම් හඳුනාගෙන නිවැරදි කොරතුරු වාර්තා කිරීමට කටයුතු කර නොතිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

4.1.1 සැලැසුම් කිරීම

2024 වර්ෂයේ අයවැය ඇස්තමේන්තුව යටතේ අමාත්‍යාංශය විසින් ඉටුකළ යුතු ප්‍රධාන කාර්යයන් යටතේ වතු ප්‍රජාව ආශ්‍රිතව ප්‍රජා නායකත්වය හා ප්‍රජා සහභාගීත්වය ප්‍රමුඛ වන "ජන මූල මණ්ඩල හා ජන මූල මධ්‍යස්ථාන පිහිටුවීම" සඳහන් කර තිබුණද වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව එම කාර්යය සැලසුම් කර ප්‍රතිපාදන වෙන් කර නොතිබුණි.

4.1.2 කාර්යභාරයන් ඉටු නොකිරීම

- වතු ප්‍රජාවගේ දරුවන්ගේ ප්‍රාථමික අධ්‍යාපනය සහ සෞඛ්‍ය පහසුකම් තහවුරු කිරීම සඳහා විශේෂ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් වාර්ෂික අයවැය ප්‍රතිපාදන යටතේ රු.මිලියන 583.08 ක් වෙන්කර තිබුණු අතර ක්‍රියාකාරී සැලැස්ම තුළ ඒ වෙනුවෙන් වැඩසටහන් 2 ක් යටතේ ව්‍යාපෘති 7 ක් සැලසුම් කර තිබුණි. කෙසේ වුවද සමාලෝචිත වර්ෂයේ ඉන් ව්‍යාපෘති 4 ක් ක්‍රියාත්මක කර තිබුණු අතර ඒ සඳහා රු.මිලියන 12.95 ක් එනම් සියයට 2.2 ක් පමණක් වැය කර තිබුණි.

4.1.3 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

(අ) වතු අංශයේ යටිතල පහසුකම් සංවර්ධන කිරීම වෙනුවෙන් වැවිලි අංශයේ සියලුම ප්‍රතිලාභීන් සඳහා දත්ත සමීක්ෂණයක් සිදු කිරීම සහ මාර්ග සංවර්ධනය යන කාර්යයන් වෙනුවෙන් පිළිවෙලින් රු.මිලියන 2 ක් සහ රු.මිලියන 5 ක් ලෙස වෙන් කර තිබුණද සමාලෝචිත වර්ෂය තුල අදාල කාර්යයන් ඉටුකර නොතිබුණි.

(ආ) ඉන්දියානු ආධාර මත නිවාස 4,000 වැඩසටහන යටතේ 2024 දෙසැම්බර් 31 දින වන විට නිවාස 3,972 ක් නිමකර පැවති අතර ඉන් නිවාස 349 ක් ප්‍රතිලාභීන් වෙත භාරදී නොතිබූ අතර නිවාස 28 ක් නිම කරමින් පැවතුණි. එමෙන්ම ඒ යටතේ ඉදිකළ නිවාස 150 ක් සඳහා විදුලිය සහ ජලය ලබාදීම වෙනුවෙන් රු.මිලියන 25 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණි. 2024 දෙසැම්බර් 31 දින වන විට රු.මිලියන 16.75 ක් වැයකර නිවාස 150 ක් සඳහා විදුලිය ලබා දීමටත්, නිවාස 50 ක් සඳහා ජල සැපයුම ලබා දීමටත් කටයුතු තිබුණි. ඒ අනුව අපේක්ෂිත නිවාසවලින් සියයට 47 ක් සඳහා විදුලි සැපයුමත්, සියයට 67 ක් සඳහා ජල සැපයුමත් ලබාදී නොතිබුණි. එසේ වුවද 2024 දෙසැම්බර් 31 දින වන විට එහි මූල්‍ය ප්‍රගතිය සියයට 67 ක් වී තිබුණි.

1.4 **ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්**

(අ) ඉඩම් අත්පත්කර ගැනීමේ පනතේ 263 නියෝගය ප්‍රකාරව හදිසි අත්‍යවශ්‍ය කරුණක් සඳහා ඉඩමේ අයිතිය 38(අ) අතුරු විධානයක් මගින් භාරගත හැකි වන අතර ජල සම්පාදන ව්‍යාපෘති 05 ක් සඳහා සහ බදුල්ල නාගරික අපජල හා මලාපවහන පද්ධතියේ පිරිපහදු ඒකකය ඉදිකිරීම සඳහා 38(අ) අතුරු විධානය යටතේ ඉඩම් අත්පත් කර ගැනීම වෙනුවෙන් 2017 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා අවස්ථා 11 කදී රු.138,105,536 ක වන්දි මුදල් සහ රු.10,859,867 ක පොලී මුදල් ගෙවා තිබුණද, 2024 ජුනි 30 දින වන විටත් අදාල ජල සම්පාදන ව්‍යාපෘතිවල ඉදි කිරීම් කටයුතු සිදුකර නොතිබුණි.

(ආ) ඉන්දියානු ආධාර මත ඉදිවන නිවාස 10,000 ව්‍යාපෘතිය යටතේ හැටන්, මහනුවර, නුවරඑළිය සහ බදුල්ල යන දිස්ත්‍රික්කවල 2024 දෙසැම්බර් 31 වන විට නිවාස 406 ක් අත්තිවාරම් මට්ටමේද, නිවාස 35 ක් බිත්ති මට්ටමේද, නිවාස 18 ක් වහල සකස් කිරීමේ මට්ටමේද යන අදියරයන්වල පැවති අතර නිවාස 5 ක් නිමකර තිබුණි. සමාලෝචිත වර්ෂයේ නිවාස 200 ක් ඉදිකිරීම වෙනුවෙන් රු.මිලියන 3,600 ක් ප්‍රතිපාදනය කර තිබුණු අතර 2024 දෙසැම්බර් 31 දින වන විට එහි මූල්‍ය ප්‍රගතිය රු.මිලියන 496.69 ක් එනම් සියයට 14 ක්වූ අතර ඒ සඳහා යටිතල පහසුකම් සංවර්ධනය කිරීම වෙනුවෙන් රු. මිලියන 300 ක ප්‍රතිපාදනයක් වෙන්කර පැවති අතර 2024 දෙසැම්බර් 31 දින වන විට එහි මූල්‍ය ප්‍රගතිය රු.මිලියන 65.40 ක් එනම් සියයට 22 ක් ව පැවතුනි.

(ඇ) වතු සමාගම් යටතේ පවතින ඉඩම්වල ඉන්දියන් ආධාර යටතේ සහ රජයේ ප්‍රතිපාදන යටතේ ඉදිකරනු ලබන නිවාස සඳහා එම නිවාස ප්‍රතිලාභී පවුල් 2000 ක් සඳහා සමාලෝචිත වර්ෂයේ වතුකරයේ නිරවුල් ඔප්පු ලබා දීමට රු.මිලියන 22.6 ක් වෙන්කර තිබුණද ඔප්පු

716 ක් පමණක් ලබා දී තිබුණු අතර ඔප්පු 1081 ක් සකස් කරමින් පැවතුණි. මේ සඳහා රු.මිලියන 20.53 ක් වැයකර ඇති අතර මූල්‍ය ප්‍රගතිය සියයට 90.84 ක් වුවද ඔප්පු ලබාදීමේ භෞතික ප්‍රගතිය සියයට 36 ක් වැනි අවම මට්ටමක විය.

(ඇ) වතු යටිතල පහසුකම් සංවර්ධන අංශය මගින් ක්‍රියාත්මක කර තිබූ නව ජීවන හා හරිත රත් නිවාස වැඩසටහන යටතේ 2017-2021 වර්ෂවලදී ඉදිකිරීම් ආරම්භ කරන් ලද නිවාස ඒකක 629 ක් 2023 සහ 2024 වර්ෂයන්හි දී නිම කර තිබූ අතර වර්ෂ 2016-2021 කාලසීමාව තුළ ඉදිකිරීම් ආරම්භ කල නිවාස ඒකක 420 ක් 2025 වර්ෂයේදී ඉදිකිරීමට සැළසුම් කර තිබුණි. 2018-2021 කාලය තුළ ඉදිකිරීම් ආරම්භ කල නිවාස ඒකක 420 න් නිවාස ඒකක 397 ක් 2025 පෙබරවාරි 28 දින වනවිටත් අවසන් වී නොතිබුණි.

4.1.5 මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති

2017 වර්ෂයේ වැඩ ආරම්භ කර තිබූ ගම්පහ, අත්තනගල්ල සහ මිනුවන්ගොඩ ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතියේ ජල මූලාශ්‍රය ලෙස බස්නාගොඩ ජලාශය ඉදි කිරීම සඳහා අත්පත්කර ගත් ඉඩම් හෙක්ටයාර 4.8584 ක් සඳහා 2024 වර්ෂයේ ජූලි 31 වන විට වන්දි හා පොළී වශයෙන් එකතුව රු.1,109,865,248 ක් අමාත්‍යාංශය විසින් ගෙවා තිබුණද, විගණන දිනය වූ 2025 මැයි වන විටත් ජල මූලාශ්‍රය ඉදිනොකිරීමෙන් ව්‍යාපෘතිය ආරම්භ කිරීමට නොහැකි වී තිබුණි.

4.2 ප්‍රසම්පාදනයන්

ජල තාක්ෂණය සඳහා වූ චීන ශ්‍රී ලංකා ඒකාබද්ධ පර්යේෂණ සහ ආදර්ශන මධ්‍යස්ථානය සඳහා 2024 වර්ෂයේදී ජාතික තරඟකාරී ලංසුකැඳවීම යටතේ රු.8,160,000 ක් වටිනා සූර්ය පැනල පද්ධතියක් හා උපාංග සැපයීම ස්ථාපිත කිරීම, පරීක්ෂා කිරීම හා ක්‍රියාත්මක කිරීමට පෞද්ගලික කොන්ත්‍රාත් සමාගමක් තෝරාගෙන එම ආයතනයේ ඉල්ලීම මත ලංසු ඉදිරිපත් කලයුතු දිනය දින 07 කින් දීර්ඝ කර තිබූ අතර ඒ පිලිබඳ පුවත්පත් දැන්වීම් මගින් ප්‍රසිද්ධ නොකිරීමෙන් වෙනත් ලංසුකරුවන්ටද ලංසු ඉදිරිපත් කිරීමට තිබූ අවස්ථාව හා වැඩි තරඟකාරීත්වයකින් ලංසුකරුවෙකු තෝරාගැනීමේ අවස්ථාව මගහැරි තිබුණි. මෙම සූර්ය පැනල පද්ධතියට අදාළ ප්‍රමාන පත්‍රවල Provisional Sum ලෙස රු.466,560 ක් වෙන්කර තිබුණු අතර එම මුදල වියදම් කිරීම අදාල බිල්පත් මගින් තහවුරු කරගැනීමකින් තොරවම මුළු මුදලම සැපයුම්කරු වෙත ගෙවා තිබුණි.

.3 වත්කම් කළමනාකරණය

ජල තාක්ෂණය සඳහා වූ චීන ශ්‍රී ලංකා ඒකාබද්ධ පර්යේෂණ සහ ආදර්ශන මධ්‍යස්ථානය වෙත චීන රජයේ ප්‍රදානයක් ලෙස 2020 වර්ෂයේදී ලැබී තිබූ රු.40,441,639 ක් වටිනා ජංගම ජල පරීක්ෂණ රථය ලැබී 2024 දෙසැම්බර් වන විට වර්ෂ 4 කට වඩා කාලයක් ගත වී තිබුණද 2024 සැප්තැම්බර් 30 දින වන විටත් කිසිදු ජල පරීක්ෂණ කටයුත්තක් සඳහා යොදාගෙන නොතිබූ අතර නඩත්තු පිරිවැය වශයෙන් රු.894,864 ක් වැයකර තිබුණි. එමෙන්ම රු.40,441,639 ක් වටිනා මෙම රථය රක්ෂණය කිරීමේදි රු.7,000,000 ක් ලෙස තක්සේරුකර ඌණ රක්ෂණයක් සිදුකර තිබුණි. මෙම රථය ජල පරීක්ෂණ කටයුතු සඳහා අවශ්‍ය සියළු උපකරණ හා පහසුකම්වලින් සමන්විත වූ අතර ජල තත්ත්ව පරීක්ෂණ සිදු කර ගැනීමට අවශ්‍ය වෙනත් ආයතනයකට ලබා දීමට හෝ ජල පරීක්ෂණ සිදුකර රජයට ආදායමක් ලබාගත හැකි ක්‍රමවේදයන් කෙරෙහි අවධානය යොමු නොකර නඩත්තු පිරිවැය දරමින් එය නිශ්කාර්ය තත්වයට පත්වීමට ඉඩහැර තිබුණි.

4 පාඩු හා හානි

(අ) අමාත්‍යාංශයට අයත් වාහන 02 කට සිදු වී තිබූ අනතුරුවලට අදාල එකතුව රු.782,900 ක්වූ අලාභ පිළිබඳව සහ නිටපු ජල සම්පාදන රාජ්‍ය අමාත්‍යවරයාට අනුයුක්ත කර තිබූ රු.මිලියන 55 ක් වටිනා අංක KP-7684 දරන V8 වර්ගයේ ජීප් රථය 2024 ජනවාරි මස 25 දින අනතුරකට ලක්වීමෙන් එම වාහනයට පූර්ණ වශයෙන් අලාභ හානි සිදුවී තිබුණු අතර ඒ සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇමුණුම (ii) හි පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශයෙහි හෙළිදරව් කර නොතිබුණි.

(ආ) රාජකාරී කටයුතු වෙනුවෙන් රාජ්‍ය අමාත්‍ය කාර්යාලයට ලබා දී තිබූ රු.1,393,042 ක වටිනාකමකින් යුතු කැමරා උපකරණ, මුද්‍රණ යන්ත්‍රයක් හා ලැප්ටොප් පරිගණකයක් අමාත්‍යවරයාගේ දේශපාලන කාර්යාලයේ තිබී 2022 මැයි 09 දින රටේ ඇති වූ කලබල හේතුවෙන් විනාශ වී තිබුණි. 2023 මැයි 11 දින ඉදිරිපත් කරන ලද වාර්තාවට අනුව මෙම උපකරණ හදිසි තත්ත්වයක් මත සම්පූර්ණයෙන්ම විනාශ වීම, උපකරණ භාරව සිටි නිළධාරීන්ට පාලනය කළ හැකි සීමාවෙන් බැහැරව වූ සිදුවීමක් ලෙස සලකා මෙම අලාභය සම්බන්ධයෙන් නිශ්චිත වගකිය යුත්තන් කවුරුන්ද යන්න තීරණය කර නොතිබුණි. එමෙන්ම මෙම උපකරණ අවසරයකින් තොරව අමාත්‍ය කාර්යාලයෙන් පිටතට ගෙනයාමට හැකි අවකාශයක් නිර්මාණය වී තිබීම පිළිබඳ පරීක්ෂණ කමිටුවේ අවධානය යොමුවී නොතිබුණි.

4.5 කළමනාකරණ දුර්වලතා

(අ) ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 38 හා 38(අ) වගන්තිය ප්‍රකාරව අත්පත් කර ගන්නා ඉඩම් සඳහා 38 නියෝගය නිකුත්කර වන්දි මුදල් ගෙවන දිනය දක්වා ඉඩම් හිමියා වෙත පොලී මුදල් ගෙවිය යුතු වේ. එසේ 38 නියෝගය නිකුත්කර ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ ජල සම්පාදන ව්‍යාපෘති වෙනුවෙන් අත්පත්කර ගත් ඉඩම් වෙනුවෙන් වර්ෂ 2 කට පසු වන්දි මුදල් ගෙවීම නිසා රු.5,274,634 ක් වසර 5 කට පසු වන්දි මුදල් ගෙවීම නිසා රු.8,106,778 ක් පොලී වශයෙන් 2024 වර්ෂයේ ජනවාරි සිට ජූලි දක්වා ගෙවීම් කර තිබුණි. ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලියේ සිදුවන ප්‍රමාදයන් නිසා මෙලෙස රජයේ මුදල් වැඩිපුර පොලී ලෙස ගෙවීම් කිරීමට සිදුවී තිබුණි.

(ආ) පෙර සිටි ජල සම්පාදන අමාත්‍යවරයාට හා රාජ්‍ය අමාත්‍යවරයාට අනුයුක්ත කර තිබූ වාහන 03 ක් 2023 හා 2024 වර්ෂයන් තුලදී අනතුරට ලක්වීම හේතුවෙන් දළ වශයෙන් රජයට රු.70,323,834 ක පාඩුවක් සිදු වී තිබුණි. මුදල් රෙගුලාසි 156(i)(ආ) ප්‍රකාරව රජය විසින් තමා වෙත නිකුත් කරන ලද්දා වූ හෝ තාවකාලික වශයෙන් හෝ ස්ථිර වශයෙන් තමා භාරයේ තබා ගැනීමට දෙන ලද්දා වූ හෝ ඕනෑම දේපලක් සුරක්ෂිතව තබා ගැනීම, නිසි පරිදි පාවිච්චි කිරීම හා විධි ප්‍රකාර සුදුසු දේ කිරීම යන මෙම කරුණු සම්බන්ධව සෑම නිළධාරියකු විසින්ම සියළුම අවස්ථාවල වගකිව යුතු වන්නේය. ඒවාට පාඩු හෝ අලාභහානි සිදු වුවහොත් හෝ ඒ පිළිබඳව උත්තර දෙන ලෙස නියම කරනු ලබන අවස්ථාවන්හි එසේ කිරීමට අපොහොසත් වුවහොත් එම අලාභයේ හෝ හානියේ වටිනාකම අදාල නිළධාරියා මත අධිභාරය කළ හැකිය. ඊට අමතර වශයෙන් අපරික්ෂාකාරී බව නොසැළකිල්ල හෝ මුදල් රෙගුලාසි හෝ දෙපාර්තමේන්තු නීති හෝ නියෝග කිසිවක් නොපිළිපැදීම සම්බන්ධයෙන් එම නිළධාරියාට විරුද්ධව විනයානුකූල ක්‍රියාමාර්ග ගත යුතුය. එසේ වුවද මෙම අනතුරුවලට සම්බන්ධ රියදුරන්/ නිළධාරීන් සම්බන්ධයෙන් අමාත්‍යාංශය විසින් එපරිදි කටයුතු කර නොතිබුණි.

(ඇ) HB - 5057 දරණ රථයේ රු.74,200 ක් වූ අළුත්වැඩියාවක් සඳහා 'නිව් රංජිත් මොටර්ස්' වෙත බාරදීමට රථයට ඉන්ධන ලබාගැනීමට අවශ්‍ය රු.7,260 ක් වටිනා ලීටර් 20 ක ඉන්ධන ඇණවුමක්ද සමඟ 2024 මාර්තු 07 දින රියදුරු වෙත බාර දී තිබූ අතර එදින රියදුරු විසින් මෙම රථය අමාත්‍යාංශ පරිශ්‍රයෙන් බැහැරට ගෙන ගොස් තිබුණද ගරාජය වෙත බාරදී තිබුණේ 2024 මාර්තු 10 වන දිනදී වේ. ඒ අනුව අමාත්‍යාංශයේ අනුමැතියකින් තොරව මෙම වාහනය දින 03 ක කාලයක් තුල කිලෝමීටර් 562 ක් හා රු.7,260 ක් වටිනා ඉන්ධන

අයථා පරිහරණය සඳහා භාවිතා කර තිබුණි. මේ සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් පවත්වා අදාල පාර්ශවයන්ට එරෙහිව මුදල් රෙගුලාසි 156(i)(අ) ප්‍රකාරව කටයුතු කර නොතිබූ අතර ආයතන සංග්‍රහය ප්‍රකාරව විනය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඇ) වාහන අළුත්වැඩියා සඳහා ආයතනවලට ලබාදීමෙදි අළුත්වැඩියා නිමකර නැවත බාරදිය යුතු දිනයන් අමාත්‍යාංශය මගින් අදාල ආයතනවලට සඳහන් නොකිරීමෙන් අළුත්වැඩියා සඳහා යොමුකල වාහන 04 ක් සැලකිය යුතු කාලයක් ගත වුවද නැවත බාර දී නොතිබුණි. ඒ පිලිබඳ අමාත්‍යාංශ නිලධාරීන් විසින් නිසි අධීක්ෂණයක් සිදුකර නොතිබූ අතර එම වාහන අවභාවිතයට, විනාශවීමට හා දිරාපත් වීමට ඉඩ සලසා තිබුණි. මේ සම්බන්ධයෙන් අදාල නිලධාරීන් මුදල් රෙගුලාසි 156(අ) ප්‍රකාරව වගකිව යුතු වන අතර එම නිලධාරීන් සම්බන්ධයෙන් විනයානුකූල ක්‍රියාමාර්ගද ගෙන නොතිබුණි.

(ඉ) සියළුම අමාත්‍යාංශ හා ඒ යටතේ ඇති ආයතනවල වෙළඳ දැන්වීම් හා ප්‍රචාරාත්මක වැඩසටහන් සැලසිනේ රූපවාහිනී ආයතනය වෙනින් ඉටුකරවා ගැනීම සඳහා 2008 දෙසැම්බර් 24 දිනැති අංක අමප/08/2253/338/043 දරණ අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී තිබුණද ඊට පටහැනිව 'ජලය අරපිරිමැස්මෙන් භාවිතා කිරීම සහ ජල සම්පාදන ක්‍රියාවලිය' ආශ්‍රිත වීඩියෝ දර්ශන 6 ක් සැකසීම සඳහා රු.1,200,000 කට පුද්ගලික ආයතනයකට ගෙවා තිබුණි. මෙම විඩියෝ දර්ශන 06 වීනාඩි 30 ක කාලයක් සඳහා නිර්මාණය කල යුතු වුවත් වීනාඩි 15 තත්පර 26 ක කාලයක් අඩුවෙන් නිර්මාණය කර තිබුණි. එසේ වුවත් ඒ සඳහා සම්පූර්ණ මුදලම ගෙවා තිබුණු අතර ඒ තුලින් රු.617,333 ක පාඩුවක් සිදුකර තිබුණි. ඒ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 156 ප්‍රකාරව අදාල නිලධාරීන්ට එරෙහිව කටයුතු කර නොතිබුණි. එමෙන්ම මෙම වීඩියෝ දර්ශන රූපවාහිනී නාලිකාවල ප්‍රචාරය කිරීම සඳහා සුදුසු ප්‍රමිතියෙන් සකස් කිරීමට රු.120,000 ක ගෙවීමක් කර තිබුණි. එසේ වුවද එම දැන්වීම රූපවාහිනී නාලිකාවල ප්‍රචාරය කිරීමට කටයුතුකර නොතිබුණි.

(ඊ) අමාත්‍යාංශය මගින් ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙත ලබාදී තිබූ ප්‍රතිපාදන මගින් කොන්ත්‍රාත් 66 ක් සඳහා 2021 සහ 2022 වර්ෂ තුල එකතුව රු.2,588,770,395 ක අත්තිකාරම් මුදල් ලබාදී තිබුණද අදාළ මුදල් උපයෝගී කරගෙන කොන්ත්‍රාත් කාර්යයන් නිම කිරීමට හෝ වැඩ නොකරනු ලබන හෝ වැඩ අතරමඟ නවතා ඇති ව්‍යාපෘතිවලට අදාළ අත්තිකාරම් මුදල් නැවත අයකර ගැනීමට විගණන දිනය වූ 2025 මාර්තු වන විටත් කටයුතු කර නොතිබුණි.

(උ) වතු යටිතල පහසුකම් සංවර්ධන අංශය විසින් රජයේ ප්‍රතිපාදන යටතේ ඉදිකරන ලද නිවාසවලට අදාළව නිවාස ඉදිකිරීමට දරන ලද පිරිවැයෙන් සියයට 50 ක මුදලක් සියයට 4 ක පොලී අනුපාතයක් යටතේ ප්‍රතිලාභීන් වෙත ණයක් ලෙස ලබා දී තිබුණි. අතර 2024 දෙසැම්බර් 31 වනවිට නිවාස ඒකක 4925 කට අදාළව එකතුව රු.2,490,279,962 ක් අයවිය යුතුව පැවති අතර ඒකුල නිවාස ඒකක 4,823 ක් සඳහා ප්‍රතිලාභීන්ගෙන් කිසිදු මුදලක් අය නොවූ ණය ශේෂය රු.2,417,428,000 ක් විය. 2023 සහ 2024 වර්ෂවල සම්පූර්ණයෙන් නිමකරන ලද නිවාස 629 ට අදාළව ප්‍රතිලාභීන්ගෙන් අයවිය යුතු මුදල් 2025 පෙබරවාරි 28 දින වනවිටත් හඳුනාගෙන නොතිබුණි. මෙම ණය මුදල් කඩිනමින් අයකිරීමට හෝ අයකර නොහැකි ණය පිළිබඳ සුදුසු ක්‍රියාමාර්ගයක් ගැනීමට අවශ්‍ය කටයුතු කර නොතිබුණි.

(ඌ) වතු ප්‍රජාව වෙනුවෙන් නිවාස ලබාදීම සඳහා 2015 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා රජයේ ප්‍රතිපාදන සහ ඉන්දියානු ආධාර යටතේ පිළිවෙලින් නිවාස 5,891 ක් සහ 3,980 ක් රත්නපුර, බදුල්ල, කෑගල්ල, මහනුවර, කලුතර, නුවරඑළිය සහ ගාල්ල යන කලාපවල නිමකර තිබුණු අතර ඉන් නිවාස ප්‍රතිලාභීන් 1,038 ක් සහ 659 ක් සඳහා පමණක් 2024 දෙසැම්බර් 31 දින වන විට ඉඩම් හිමිකම් ඔප්පු ලබා දී තිබුණි. ඒ අනුව නිම කරන ලද නිවාසවලින් ඉඩම් හිමිකම් ඔප්පු ලබාදීමේ ප්‍රගතිය රජයේ ප්‍රතිපාදන යටතේ සියයට 17.62 ක් සහ ඉන්දියානු ආධාර යටතේ සියයට 16.55 ක් විය.

(එ) ඉන්දියානු නිවාස 4000 වැඩසටහන යටතේ නුවරඑලිය, මාතලේ, නුවර හා බදුල්ල යන දිස්ත්‍රික්කයන්හි ඉදිකරන ලද නිවාස වෙනුවෙන් ඉඩම් හිමිකම් ඔප්පු ලබාදීමේදී ඉදිකරන ලද නිවාස 655 ක් සඳහා 2024 නොවැම්බර් 26 දින වන විටත් ඉඩම් හිමිකම් ඔප්පු ලබාදී නොතිබුණි. එයින් නිවාස 63 ක් 2024 ජුනි 24 වන දින වන විට ඉඩම් රෙජිස්ට්‍රාර්වරයා විසින් ලියාපදිංචි කර තිබුණද 2025 මාර්තු 21 දින වන විටත් හිමිකම් සහිත පාර්ශවයන්ට හිමිකම් ඔප්පු ලබා දීමට කටයුතු කර නොතිබූ අතර මාතලේ දිස්ත්‍රික්කයේ රත්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශයේ ඉදිකරන ලද නිවාස 6 ක ප්‍රතිලාභීන් පදිංචි නොවීම හේතුවෙන් අදාළ හිමිකම් ඔප්පු ලබාදී නොතිබුණි.

(ඒ) රත්නපුර, බදුල්ල, කෑගල්ල, මහනුවර, කළුතර, නුවරඑළිය සහ ගාල්ල යන කලාප 7 ක් ආවරණය වන පරිදි ක්‍රියාත්මක වූ නව ජීවන සහ හරිත රන් නිවාස වැඩසටහන් යටතේ 2015 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා කාලසීමාව තුළ නිවාස ඒකක 5262 ක් සාදා නිම

කර තිබූ අතර එයින් නිවාස ඒකක 1722 ක් නියමිත කාලය තුළ දී ප්‍රතිලාභීන් වෙත පවරා දී තිබේ ද යන්න පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොවුණි.

5. **තිරසාර සංවර්ධනය**

5.1 **තිරසර සංවර්ධන අරමුණු ඉටු කිරීමේ ප්‍රගතිය**

තිරසාර සංවර්ධන අරමුණු 04 යටතේ සැමට සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ ජීවිත කාලය පුරාම ඉගෙනීමේ අවස්ථාවන් ප්‍රවර්ධනය කිරීම යන අරමුණු පෙරදැරිව නුවරඑළිය, මහනුවර හා බදුල්ල යන දිස්ත්‍රික්කවල වතු ප්‍රජාව වෙනුවෙන් සුහුරු පන්ති කාමර ස්ථාපිත කිරීම සඳහා 2023 වර්ෂයේදී රු.මිලියන 135 ක්ද 2024 වර්ෂයේදී ඉන්දීය ආධාර යටතේ උපකරණ සැපයීම වෙනුවෙන් රු.මිලියන 300 ක් සහ පන්ති කාමර අළුත්වැඩියා වෙනුවෙන් රජයේ ප්‍රතිපාදන රු.මිලියන 10 ක් වෙන්කර තිබුණද 2024 දෙසැම්බර් 31 දක්වා ඊට අදාළ කිසිදු කාර්යයක් සිදුකර නොතිබුණි.

එම්.ඒ.එස්.පුෂ්පරාණි
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට.